# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2003 අංක 18 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කලේ 2003 අප්‍රේල් මස 29 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2003 මැයි මස 02 වැනි දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ** ගැසට් **පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

---

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : රු. **36.50** යි.    තැපැල් ගාස්තුව : රු. **11.25** යි.

## 2003 අංක 18 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2003 අප්‍රේල් මස 29 වන දින]

එල්.ඩී.—ඕ. 03/2002.

### 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 2003 අංක 18 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. 1991 අංක 26 දරන පනතින් සංශෝධිත (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ දීර්ඝ නාමයේ "සුරැකුම්පත් වෙළෙඳ ව්‍යාපාරයෙහි යෙදෙන ව්‍යාපාර වස්තු විනිමය ස්ථානවලට, ඒකක භාරකරුවන්ට, ව්‍යාපාර වස්තු වෙළෙන්දන්ට, සහ ව්‍යාපාර වස්තු තැරැව්කරුවන්ට බලපත්‍ර ප්‍රදානය කිරීම සඳහා ද" යන වචන වෙනුවට "සුරැකුම්පත් වෙළෙඳ ව්‍යාපාරයෙහි යෙදෙන ව්‍යාපාර වස්තු විනිමය ස්ථානවලට, එක් එක් ඒකක භාරයක කළමනාකරණ සමාගම්වලට, ව්‍යාපාර වස්තු තැරැව්කරුවන්ට සහ ව්‍යාපාර වස්තු වෙළෙන්දන්ට බලපත්‍ර ප්‍රදානය කිරීම සඳහා ද වෙළෙඳපොළ අතරමැදියන් ලියාපදිංචි කිරීම සඳහා ද" යන වචන ආදේශ කිරීමෙන් එම දීර්ඝ නාමය මෙයින් සංශෝධනය කරනු ලැබේ. 1987 අංක 36 දරන පනතෙහි දීර්ඝ නාමය සංශෝධනය කිරීම.

3. 1991 අංක 26 දරන පනතින් සංශෝධිත පරිදි වූ, ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය, එහි (ඇ) ඡේදයේ "ව්‍යාපාර වස්තු තැරැව්කරුවකු හෝ ව්‍යාපාර වස්තු වෙළෙන්දකු සිය ගිවිසුම් පිළිබඳ බැඳීම් ඉටු කිරීමට අසමත් වීම හේතුවෙන්" යන වචන වෙනුවට "බලපත්‍රලත් ව්‍යාපාර වස්තු තැරැව්කරුවකු හෝ බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු වෙළෙන්දකු සිය ගිවිසුම් බැඳීම් ඉටු කිරීමට අසමත් බව තීරණය කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන්" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් තව දුරටත් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය සංශෝධනය කිරීම.

2—H 017161—4,500 (2002/11)

ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. 1991 අංක 26 දරන පනතින් සංශෝධිත පරිදි වූ ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය, පහත දැක්වෙන පරිදි තව දුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (ආආ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(ආආආ) යම් පුද්ගලයකුට වෙළෙඳපොළ අතරමැදියකු ලෙස ව්‍යාපාර කටයුතු පවත්වා ගෙන යාම සඳහා ලියාපදිංචි කිරීමේ සහතිකයක් ප්‍රදානය කිරීම සහ ඒ ව්‍යාපාර කටයුත්ත යථා පරිදි පවත්වා ගෙන යන බවට වගබලා ගැනීම;".

(2) ඒ වගන්තියේ (ඇ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(ඇ) බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයකට හෝ බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු තැරැව්කරුවකුට හෝ බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු වෙළෙන්දකුට හෝ ඒකක භාරයක බලපත්‍ර ලත් කළමනාකරණ සමාගමකට හෝ භාරකරුට හෝ ලියාපදිංචි වෙළෙඳපොළ අතරමැදියකුට, කලින් කල, සාමාන්‍ය හෝ විශේෂ විධාන නිකුත් කිරීම ;".

(3) එම වගන්තියේ (ඇ) ඡේදයේ "බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු වෙළෙන්දකු හෝ බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු තැරැව්කරුවකු සිය ගිවිසුම් පිළිබඳ බැඳීම් ඉටු කිරීමට අසමත් වීමේ හේතුවෙන්" යන වචන වෙනුවට "යම් බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු තැරැව්කරුවකු හෝ බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු වෙළෙන්දකු සිය ගිවිසුම්ගත බැඳීම් ඉටු කිරීමට අපොහොසත් වීමේ ප්‍රතිඵලයක් වශයෙන්" යන වචන ආදේශ කිරීමෙන් ;

(4) එම වගන්තියේ (ඊ) ඡේදයට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් ඡේද ඇතුළත් කිරීමෙන් :—

"(උ) බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක සුරැකුම්පත් ලැයිස්තුගත කිරීම සහ නිකුත් කිරීම විධිමත් කිරීම ;

(උඋ) ලැයිස්තුගත කිරීම සඳහා බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයකට ඉදිරිපත් කරන ලද යම් ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරන ලෙස ඊට විධාන කිරීම ;".

(5) එම වගන්තියේ (ඌ) ඡේදයේ "ලැයිස්තුගත කළ සුරැකුම්පත් කිසිවක්" යන වචන වෙනුවට "ලැයිස්තුගත සුරැකුම්පත් කිසිවක්" යන වචන ආදේශ කිරීමෙන් ;

(6) එම වගන්තියේ (එ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(එ) බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක, බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු තැරැව්කරුවකුගේ හෝ බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු වෙළෙන්දකුගේ, ඒකක භාරයක බලපත්‍ර ලත් කළමනාකරණ සමාගමක් හෝ භාරකරුවකුගේ, ලියාපදිංචි වෙළෙඳපොල අතරමැදියකුගේ හෝ යම් ලැයිස්තුගත පොදු සමාගමක, යම් කටයුත්තක් ගැන පරීක්ෂා කර විමර්ශන පැවැත්වීම ;".

(7) ඒ වගන්තියේ (ඒ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(ඒ) යම් බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු තැරැව්කරුවකු විසින් හෝ බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු වෙළෙන්දකු විසින් හෝ ඒකක භාරයක බලපත්‍ර ලත් කළමනාකරණ සමාගමක් විසින් හෝ භාරකරුවකු විසින් හෝ ලියාපදිංචි වෙළෙඳපොල අතරමැදියකු විසින් හෝ ලැයිස්තුගත පොදු සමාගමක් විසින් හෝ සිදු කරන ලද අයුතු ක්‍රියා පිළිබඳ තීරණ ප්‍රකාශයට පත් කිරීම ;";

(8) ඒ වගන්තියේ (ච) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේද ආදේශ කිරීමෙන් :—

"(ච) පවරා ගැනීම හෝ ඒකාබද්ධ කිරීම, ලැයිස්තුගත සමාගම් එකක් හෝ වැඩි ගණනක්

අතර වන අවස්ථාවක හෝ පවරා ගැනීමට හෝ ඒකාබද්ධ කිරීමට සම්බන්ධ පාර්ශ්වකරුවන්ගෙන් එක් පාර්ශ්වකරුවකු හෝ ලැයිස්තුගත පොදු සමාගමක් වන අවස්ථාවක, පවරා ගැනීම හෝ ඒකාබද්ධ කිරීම් විධිමත් කිරීම ;

(ජ) මේ පනතේ විධිවිධාන හෝ ඒ යටතේ සාදන ලද යම් රීතියක් හෝ නියෝගයක්, යම් තැනැත්තකු විසින් සිදු කරනු ලැබුවා යයි කියනු ලබන උල්ලංඝනය කිරීමක් හෝ කඩ කිරීමක් පිළිබඳව, විමර්ශන පැවැත්වීම ; සහ

(ට) මේ පනත යටතේ කොමිෂන් සභාවේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට හෝ එහි බලතල ක්‍රියාත්මක කිරීමට ආනුෂංගික වන නැතහොත් හිතකර වන වෙනත් සියලු ක්‍රියා කිරීම.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය සංශෝධනය කිරීම.

**5.** 1991 අංක 26 දරන පනතින් සංශෝධිත පරිදි වූ ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය පහත දැක්වෙන පරිදි තව දුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (අ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(අ) බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථාන, බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු තැරැව්කරුවන් හෝ බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු වෙළෙන්දන්, ඒකක භාරයක බලපත්‍ර ලත් කළමනාකරණ සමාගම් හෝ ලියාපදිංචි වෙළෙඳපොල අතරමැදියන්, මේ පනතේ විධිවිධානවලට හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගවලට හෝ රීතිවලට අනුකූලව ක්‍රියා කරන්නේ දැයි තීරණය කිරීම සඳහා එම බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානවල, බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු තැරැව්කරුවන්ගේ, බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු වෙළෙන්දන්ගේ, ඒකක භාරයක බලපත්‍ර ලත් කළමනාකරණ සමාගම්වල හෝ භාරකරුගේ හෝ ලියාපදිංචි වෙළෙඳපොල අතරමැදියන්ගේ ක්‍රියාකාරකම් පරීක්ෂා කිරීම සඳහා ද

ක්‍රියාකාරකම් පරීක්ෂා කරනු ලැබූ සහ (අවස්ථාවෝචිත පරිදි) එසේ පරීක්ෂා කිරීම සඳහා දරන ලද වියදම ඒ බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයෙන්, බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු තැරැව්කරුගෙන් හෝ බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු වෙළෙන්දාගෙන්, ඒකක භාරයක බලපත්‍ර ලත් කළමනාකරණ සමාගමෙන් හෝ භාරකරුගෙන් හෝ ලියාපදිංචි වෙළෙඳපොල අතරමැදියාගෙන්, අයකර ගැනීම සඳහා ද ;";

(2) ඒ වගන්තියේ (ආ) ඡේදයේ "බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානවලට, ව්‍යාපාර වස්තු තැරැව්කරුවන්ට, ව්‍යාපාර වස්තු වෙළෙන්දන්ට සහ බලපත්‍ර ලත් ඒකක භාරවල කළමනාකරණ සමාගම්වලට" යන වචන වෙනුවට "බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානවලට, බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු තැරැව්කරුවන්ට, බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු වෙළෙන්දන්ට, ඒකක භාරවල බලපත්‍ර ලත් කළමනාකරණ සමාගම්වලට සහ ලියාපදිංචි වෙළෙඳපොල අතරමැදියන්ට" යන වචන අදේශ කිරීමෙන් ; සහ

(3) ඒ වගන්තියේ (ඇ) ඡේදයේ "බලපත්‍ර ලත් ඒකක භාරයෙහි කළමනාකරණ සමාගම" යන වචන සහ "නියමිත විස්තර" යන වචන වෙනුවට පිළිවෙලින් "ඒකක භාරයක බලපත්‍ර ලත් කළමනාකරණ සමාගම" සහ "කොමිෂන් සභාව විසින් කලින් කල තීරණය කරනු ලැබිය හැකි විස්තර" යන වචන ආදේශ කිරීමෙන්.

6. 14 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒවා ප්‍රධාන ප්‍රඥප්තියේ 14අ සහ 14ආ වගන්ති වශයෙන් බලාත්මක විය යුතු ය :— 14අ සහ 14ආ අලුත් වගන්ති ප්‍රධාන ප්‍රඥප්තියෙහි ඇතුළත් කිරීම.

"සෙස් බද්ද අය කිරීම.

14අ. (1) ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන අනුප්‍රමාණයකට අනුව වූ සෙස් බද්දක්, බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක වාර්තාගත හෝ එහි රීති යටතේ එවැනි ගැණුම්කරුවකු සහ විකුණුම්කරුවකු යන දෙදෙනා

ම විසින් ඊට දන්වන ලද හෝ, සුරැකුම්පත් සෑම මිල දී ගැනීමක් හෝ විකිණීමක් සම්බන්ධයෙන්, නියම කිරීම, අය කිරීම හා ගෙවීම කරනු ලැබිය යුතු ය. එකිනෙකට වෙනස් පන්තිවලට අයත් සුරැකුම්පත් සඳහා එකිනෙකට වෙනස් අනුප්‍රමාණ නියම කරනු ලැබිය හැකි ය.

(2) මේ වගන්තිය යටතේ පනවනු ලබන සෙස් බද්ද, වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ අය කරනු ලබන වෙනත් යම් බද්දකට හෝ සෙස් බද්දකට අමතරව විය යුතු ය.

සෙස් බදු අරමුදල.

14ආ. (1) සෙස් බදු අරමුදල යනුවෙන් හඳුන්වනු ලබන අරමුදලක් පිහිටුවනු ලැබිය යුතු අතර, 14අ වගන්තිය යටතේ අය කරන ලද සෙස් බද්දෙන් ලැබෙන මුදල් එම අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(2) කොමිෂන් සභාව විසින් බලය දෙනු ලබන මුදල් ප්‍රමාණ සෙස් බදු අරමුදලෙන් පහත දැක්වෙන කාර්ය සඳහා ගෙවිය යුතු ය :—

(අ) සුරැකුම්පත් වෙළෙඳපොළ දියුණු කිරීම ;

(ආ) 38 වන වගන්තිය යටතේ පිහිටුවන ලද වන්දි අරමුදලේ බැරට ඇති මුදල් ප්‍රමාණය වැඩි කිරීම ; සහ

(ඇ) කොමිෂන් සභාවේ අරමුණු සාක්ෂාත් කර ගැනීමේ කාර්ය සඳහා එහි බලතල, කාර්ය හා කර්තව්‍ය, ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ කිරීම.

(3) සෙස් බදු අරමුදලේ බැරට ඇති මුදල් කොමිෂන් සභාව විසින් ,කොමිෂන් සභාව තීරණය කරනු ලබන ආකාරයට, ආයෝජනය කළ හැකි ය.''.

2.

ප්‍රධාන ප්‍රඥප්තියේ III වන කොටසේ ශීර්ෂය ප්‍රතියෝජනය කිරීම.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තියට පෙරාතුව වූ III වන කොටසේ ශීර්ෂය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන ශීර්ෂය ආදේශ කරනු ලැබේ :—

"ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයකට, ව්‍යාපාර වස්තු නැරැව්කරුවකුට හෝ ව්‍යාපාර වස්තු වෙළෙන්දකුට බලපත්‍ර ප්‍රදානය කිරීම සහ වෙළෙඳපොල අතරමැදියන් ලියාපදිංචි කිරීම.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය සංශෝධනය කිරීම.

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තියේ "අවස්ථාවෝචිත පරිදි, ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක්" යන වචනවල සිට එම වගන්තියේ අවසානය දක්වා වූ සියලු වචන ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන වචන ආදේශ කිරීමෙන්, එම වගන්තිය සංශෝධනය කරනු ලැබේ :—

"අවස්ථාවෝචිත පරිදි, ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක්, ව්‍යාපාර වස්තු නැරැව්කරුවකු හෝ ව්‍යාපාර වස්තු වෙළෙන්දකු වශයෙන් බලපත්‍රයක් ප්‍රදානය කරනු ලැබීම සඳහා ඉල්ලුම් පත්‍රයක්, තත් කාර්යය සඳහා කොමිෂන් සභාව විසින් කලින් කල නියමිතව සඳහන් කරනු ලබන සහාව විසින් කලින් කල නියමිතව සඳහන් කරනු ලබන යම් ආකෘතියකින්, එසේ සඳහන් කරනු ලබන යම් ලේඛන හා ගාස්තු ද සමග, කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.".

19අ අලුත් වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියෙහි ඇතුළත් කිරීම.

9. 19 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 19අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය :—

"වෙළෙඳපොල අතරමැදියන් ලියාපදිංචි කිරීම.

19අ. (1) ලියාපදිංචි වෙළෙඳපොල අතරමැදියකු වශයෙන් ව්‍යාපාර කටයුතු කර ගෙන යන හෝ කර ගෙන යාමට අදහස් කරන යම් තැනැත්තකු, තත් කාර්යය සඳහා කොමිෂන් සභාව වෙත ලියාපදිංචි කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ලියාපදිංචි කිරීමේ කාර්යය සඳහා වූ ඉල්ලුම් පත්‍රයක්, කොමිෂන් සභාව විසින් තත් කාර්යය සඳහා කලින් කල නිශ්චිතව සඳහන් කරනු ලබන ආකෘතියකින්, එසේ සඳහන් කරනු ලබන ලේඛන හා ගාස්තු සමග කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු ය.

(3) ලියාපදිංචි වීම සඳහා වූ ඉල්ලුම් පත්‍රයක් ලැබුණු විට කොමිෂන් සභාව විසින්, එම ඉල්ලුම් පත්‍රයේ සඳහන් කරුණු සැලකිල්ලට ගෙන හා අවශ්‍ය යයි පෙනී යන අවස්ථාවක දී ඉල්ලුම්කරුට කරුණු ඉදිරිපත් කිරීමේ අවස්ථාවක් ලබා දී වෙළෙඳපොල අතරමැදියකු වශයෙන් ඉල්ලුම්කරු ලියාපදිංචි කරනු ලැබ ඇති බව හෝ නොලැබ ඇති බව ඔහුට ලිඛිත දැන්වීමක් මගින් දැනුම් දෙනු ලැබිය යුතු අතර, වෙළෙඳපොල අතරමැදියකු වශයෙන් ඔහු ලියාපදිංචි කරනු ලබන අවස්ථාවක දී, නිකුත් කිරීමේ දින සිට එක් අවුරුද්දක් වලංගු වන ලියාපදිංචි කිරීමේ සහතිකයක් ඔහු වෙත නිකුත් කරනු ලැබිය යුතු ය. ලියාපදිංචි කිරීමේ සහතිකයක් නිකුත් කරනු ලැබූ සෑම තැනැත්තකු ම මෙම පනතෙහි "ලියාපදිංචි වෙළෙඳපොල අතරමැදියකු" ලෙස සඳහන් කරනු ලැබේ.

(4) මෙහි උපලේඛනයේ V වන කොටසේ දක්වා ඇති නියම සහ කොන්දේසිවලට එකඟව ක්‍රියා කරන්නේ නම් මිස, යම් තැනැත්තකු වෙළෙඳපොල අතරමැදියකු ලෙස ලියාපදිංචි කරනු නොලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය සංශෝධනය කිරීම.

**10.** 1991 අංක 26 දරන පනතින් සංශෝධිත පරිදි වූ ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය, පහත දැක්වෙන පරිදි තව දුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ ඇති "එකී බලපත්‍රයේ කාලය ඉකුත් වීමට පෙර වූ මාස හය ඇතුළත" යන වචන වෙනුවට "එකී බලපත්‍රයේ කාලය ඉකුත්වීමට මාස හයකට පෙර" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(2) බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු තැරැව්කරුවකු හෝ බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු වෙළෙන්දකු හෝ ලියාපදිංචි වෙළෙඳපොල අතරමැදියකු හෝ විසින් අවස්ථාවෝචිත පරිදි එම බලපත්‍රයේ හෝ ලියාපදිංචි වීමේ සහතිකයේ වලංගු කාලය ඉකුත් වීමට මාස

තුනකට පෙර, තම බලපත්‍රය හෝ ලියාපදිංචිය අලුත් කිරීම සඳහා, පරිදි, නියමිත ආකෘති පත්‍රයේ සාරානුකූල වූ අයදුම් පත්‍රයක් එවැනි බලපත්‍රයක් හෝ ලියාපදිංචියක් අලුත් කිරීම සඳහා වූ නියමිත ගාස්තුව සමග, කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය හැකි ය"; සහ

(3) එම වගන්තියේ (3) වන උපවගන්තියේ "බලපත්‍රය අලුත් කිරීමක දී" යන වචන වල සිට "ව්‍යාපාර වස්තු තැරැව්කරු විසින්" යන වචන දක්වා වූ සියලු වචන ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන වචන ආදේශ කිරීමෙන් :—

"බලපත්‍රය හෝ ලියාපදිංචිය අලුත් කිරීමක දී, අවස්ථාවෝචිත පරිදි, බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය, බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු තැරැව්කරු, බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු වෙළෙන්දා හෝ ලියාපදිංචි වෙළඳපොළ අතරමැදියා විසින්".

11. 1991 අංක 26 දරන පනතින් සංශෝධිත පරිදි වූ, ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තියේ (4) වන සහ (5) වන උපවගන්තිවල "බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු තැරැව්කරුවකු හෝ ව්‍යාපාර වස්තු වෙළෙන්දකු" යන වචන යෙදී ඇති සෑම තැනක ම, ඒ වචන වෙනුවට "බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු තැරැව්කරුවකු හෝ බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු වෙළෙන්දකු" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය සංශෝධනය කිරීම.

12. 21 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 21අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය :—

21අ අලුත් වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියෙහි ඇතුළත් කිරීම.

"ලියාපදිංචිය අත්හිටුවීම සහ අවලංගු කිරීම.

21අ. (1) මේ පනතේ 19අ වගන්තිය යටතේ වෙළෙඳපොළ අතරමැදියකුට ප්‍රදානය කරන ලද ලියාපදිංචි වීමේ සහතිකයක් අත්හිටුවීමේ හෝ අවලංගු කිරීමේ බලය, කොමිෂන් සභාව සතුව ඇත.

(2) (1) වන උපවගන්තිය යටතේ ලියාපදිංචි වීමේ සහතිකයක් අවස්ථාවෝචිත පරිදි, අත්හිටුවීම හෝ අවලංගු කිරීම සම්බන්ධයෙන්, මේ පනතේ 21 වන වගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**13.** 1991 අංක 26 දරන පනතින් සංශෝධිත පරිදි වූ, ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, පහත දැක්වෙන වගන්තිය ඒ වෙනුවට ආදේශ කරනු ලැබේ :—

"අභියාචනාධිකරණයට අභියාචන කිරීම.

22. (1) (අ) 18අ වගන්තිය යටතේ වන බලපත්‍රයක් අවලංගු කිරීම හෝ අත්හිටුවීම කරමින් ;

(ආ) 19 වන වගන්තිය යටතේ බලපත්‍රයක් හෝ 19අ වගන්තිය යටතේ ලියාපදිංචියක් ප්‍රදානය කිරීම ප්‍රතික්ෂේප කරමින් ;

(ඇ) 20 වන වගන්තිය යටතේ අවස්ථාවෝචිත පරිදි බලපත්‍රයක් හෝ ලියාපදිංචියක් අලුත් කිරීම ප්‍රතික්ෂේප කරමින් ; හෝ

(ඈ) 21 වන හෝ 21අ වගන්ති යටතේ අවස්ථාවෝචිත පරිදි බලපත්‍රයක් හෝ ලියාපදිංචියක් අවලංගු කරමින් හෝ අත්හිටුවමින්,

කොමිෂන් සභාව විසින් කරන ලද තීරණයකින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින් එම තැනැත්තාට තීරණය පිළිබඳව දැන්වූ දින සිට දින දාහතරක් ඇතුළත, එම තීරණයට විරුද්ධව අභියාචනාධිකරණයට අභියාචන කළ හැකි ය.

(2) මේ වගන්තිය යටතේ වූ අභියාචනවලට අදාළව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 136 වන ව්‍යවස්ථාව යටතේ රීති සාදන තෙක්, අභියාචනාධිකරණයට ප්‍රතිශෝධන වශයෙන් ඉදිරිපත් කරනු ලබන ඉල්ලුම්පත්‍රවලට අදාළව එම ව්‍යවස්ථාව යටතේ සාදන ලද රීති, මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ කරන ලද සෑම අභියාචනයකට ම, අදාළ විය යුතු ය.

(3) අභියාචනාධිකරණය විසින්, (1) වන උපවගන්තිය යටතේ එය වෙත කරන ලද අභියාචනයක් මත කොමිෂන් සභාව විසින් කරන ලද තීරණය ප්‍රතිවර්තනය කිරීම, සුළු ලෙස වෙනස් කිරීම හෝ ඉවතලීම හෝ යුක්තිය ඉටුවීම සඳහා අවශ්‍ය ආඥා කිරීම හෝ කළ හැකි ය.".

14. 1991 අංක 26 දරන පනතින් සංශෝධිත පරිදි වූ, ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තව දුරටත් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(1) අවස්ථාවෝචිත පරිදි, බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක් හෝ බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු තැරැව්කරුවකු හෝ බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු වෙළෙන්දකු විසින් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක් වශයෙන් හෝ ව්‍යාපාර වස්තු තැරැව්කරුවකු වශයෙන් හෝ ව්‍යාපාර වස්තු වෙළෙන්දකු වශයෙන් හෝ අවස්ථාවෝචිත පරිදි බලපත්‍රයක් ලබා ගැනීම සඳහා හෝ බලපත්‍රයක් අලුත් කිරීම සඳහා කරන ලද ඉල්ලීමෙහි එවකටත් සපයා ඇති වැදගත් විස්තරවල යම් වෙනසක් සිදු කිරීමට අදහස් කරන්නේ නම් හෝ එහි සඳහන් කර ඇති තත්ත්වයේ වෙනසක් ඇති කරන්නේ නම් හෝ ඇති කිරීමට අදහස් කරන්නේ නම්, ඒ වෙනස් කිරීම හෝ වෙනස ඇති කිරීමට පෙර කොමිෂන් සභාවට දන්වා කොමිෂන් සභාවේ පූර්ව එකඟත්වය ලබා ගැනීම, අවස්ථාවෝචිත පරිදි ඒ බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයේ හෝ බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු තැරැව්කරුගේ හෝ බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු වෙළෙන්දාගේ කාර්යය විය යුතු ය."

(2) එම වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

"(1අ) ලියාපදිංචි වෙළෙඳපොළ අතරමැදියකු විසින්, වෙළෙඳපොළ අතරමැදියකු වශයෙන් ලියාපදිංචි වීම සඳහා හෝ ලියාපදිංචිය අලුත් කිරීම සඳහා කරන ලද ඉල්ලීමෙහි එවකටත් තමන් විසින් සපයා ඇති විස්තරවල යම් වෙනසක් කිරීමට අදහස් කරන්නේ නම් හෝ එහි සඳහන් කර ඇති තත්ත්වයේ වෙනසක් ඇති කරන්නේ නම් හෝ ඇති කිරීමට අදහස් කරන්නේ නම්, ඒ වෙනස් කිරීම හෝ වෙනස ඇති කිරීම පිළිබඳව වහාම කොමිෂන් සභාවට දැන්වීම ඒ ලියාපදිංචි වෙළෙඳපොළ අතරමැදියාගේ යුතුකම විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තිය සංශෝධනය කිරීම.

**15.** 1991 අංක 26 දරන පනතින් සංශෝධිත පරිදි වූ, ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තිය පහත දැක්වෙන පරිදි තව දුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියෙහි (1) වන උපවගන්තියේ :—

(අ) "කොටස්" හෝ "කොටස" යන වචන යෙදෙන සෑම තැනකම ඒ වෙනුවට පිළිවෙලින් "සුරැකුම්පත්" හෝ "සුරැකුම්පත" යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) ඒ උපවගන්තියේ (ආ) ඡේදය ඉවත් කිරීමෙන් : සහ

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ "ව්‍යාපාර වස්තු තැරැව්කරුවෙක් හෝ ව්‍යාපාර වස්තු වෙළෙන්දෙක්", යන වචන වෙනුවට "බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු තැරැව්කරුවෙක් හෝ බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු වෙළෙන්දෙක් හෝ ඒකක භාරයක බලපත්‍ර ලත් කළමනාකරණ සමාගමක් හෝ ලියාපදිංචි වෙළෙඳපොළ අතරමැදියෙක්" යන වචන ආදේශ කිරීමෙන්.

28අ අලුත් වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියෙහි ඇතුළත් කිරීම.

**16.** 28 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 28අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය :—

"ඇතැම් අවස්ථාවල දී කොටස් ලැයිස්තුගත කිරීම තහනම් කිරීම.

28අ. යම් පොදු සමාගමක කොටස් බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක ඒවා ලැයිස්තුගත කිරීමට පෙර යම් තැනැත්තකු වෙත වෙන් කරනු ලබන අවස්ථාවක දී, තත් කාර්ය සඳහා කොමිෂන් සභාවේ පූර්ව ලිඛිත අනුමතය ලබා ගන්නේ නම් මිස, එම අවසාන වෙන් කිරීමේ දින සිට එක් වර්ෂයක කාලයක් ඇතුළත ඒ සමාගමේ කොටස් හෝ කොටස්වලට පරිවර්තනය කළ හැකි යම් සුරැකුම්පත් කිසිවක් බලපත්‍ර ලත් විනිමය ස්ථානයක ලැයිස්තුගත කරනු නොලැබිය යුතු ය.".

29අ අලුත් වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියෙහි ඇතුළත් කිරීම.

**17.** 29 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 29අ වගන්තිය වශයෙන් බලාත්මක විය යුතු ය :—

"සුරැකුම්පත් නිකුත් කිරීම.

29අ. (1) සුරැකුම්පත් නිකුත් කිරීම කොමිෂන් සභාව විසින් හෝ තත් කාර්යය සඳහා කොමිෂන් සභාව විසින් බලය දෙන ලද යම් තැනැත්තකු විසින් හෝ අනුමත කර ඇත්නම් මිස, ලැයිස්තුගත පොදු සමාගමක් විසින් හෝ බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක ලැයිස්තුගත කිරීමක් ලබා ගැනීමට ඉල්ලුම් කර ඇති යම් පොදු සමාගමක් විසින් හෝ සුරැකුම්පත් නිකුත් කිරීමක් කරනු නොලැබිය යුතු ය.

(2) මේ වගන්තියේ කාර්ය සඳහා "සුරැකුම්පත් නිකුත් කිරීම" යන්නෙන්—

(අ) බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක ලැයිස්තුගත කිරීමක් සඳහා ඉල්ලුම් කර ඇති පොදු සමාගමක් සම්බන්ධයෙන්

වන විට, සුරැකුම්පත් හඳුන්වා දීමක්, දායකත්වය සඳහා අර්පණයක්, විකිණීම සඳහා අර්පණයක් හෝ යම් සුරැකුම් ස්ථානගත කිරීමක් ;

(ආ) ලැයිස්තුගත පොදු සමාගමක් සම්බන්ධයෙන් යෙදෙන විට—

(i) නව නිකුත් කිරීම් හෝ විකිණීම සඳහා ඉදිරිපත් කිරීම්, මහජනතාව වෙත නිකුත් කිරීම් මගින් හෝ අන්‍යාකාරයෙන් හෝ වුව ද, ඒ නව නිකුත් කිරීම් හෝ මහජනතාව වෙත සුරැකුම්පත් විකිණීම සඳහා ඉදිරිපත් කිරීමක් හෝ සුරැකුම්පත් ස්ථානගත කිරීමක් ;

(ii) සුරැකුම්පත් පිළිබඳ හිමිකම් නිකුත් කිරීමක් ;

(iii) සුරැකුම්පත් පිළිබඳ ප්‍රසාද නිකුත් කිරීමක් ;

(iv) සකස් කිරීම පිළිබඳ යෝජනා ක්‍රම, ප්‍රතිසංස්කරණ යෝජනා ක්‍රම, අත්කර ගැනීමේ යෝජනා ක්‍රම, කොටස් මනාප යෝජනා ක්‍රම යන සුරැකුම්පත් නිකුත් කිරීම් මගින් වත්කම් අත්කර ගැනීමේ යෝජනා ක්‍රම,

අදහස් වේ.

18. ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තිය ඉවත් කිරීම.

19. ප්‍රධාන ප්‍රඥප්තියේ 31අ වගන්තියට පෙරාතුව ම වූ IIIඅ කොටසේ ශීර්ෂය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන ශීර්ෂය ආදේශ කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ IIIඅ කොටසේ ශීර්ෂය ප්‍රතියෝජනය කිරීම.

"ඒකක භාරයක් පවත්වා ගෙන යාම සඳහා බලපත්‍රයක් ප්‍රදානය කිරීම"

20. ප්‍රධාන ප්‍රඥප්තියේ 31අ වගන්තිය, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තිය වශයෙන් නැවත අංක කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 31අ වගන්තිය නැවත අංක කිරීම.

21. ප්‍රධාන ප්‍රඥප්තියේ 31ආ වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, පහත දැක්වෙන වගන්තිය ඒ වෙනුවට ආදේශ කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 31ආ වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"ඒකක භාරයක් පවත්වා ගෙන යාම සඳහා බලපත්‍රයක් ප්‍රදානය කිරීම සඳහා ඉටු කළ යුතු නියමයන්.

31අ. (1) ඒකක භාරයක් පවත්වා ගෙන යාම සඳහා මේ කොටස යටතේ බලපත්‍රයක්—

(අ) භාරකරු, කොමිෂන් සභාව විසින් අනුමත කර ඇත්නම් මිස ; සහ

(ආ) කළමනාකරණ සමාගම මෙහි උපලේඛනයේ IV වන කොටසේ දක්වා ඇති නියමයන් හා කොන්දේසිවලට අනුකූලව කටයුතු කළහොත් මිස,

ප්‍රදානය නොකළ යුතු ය.

(2) (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ විධිවිධාන කුමක් වුව ද, කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද භාරකරු බලපත්‍රයක් නිකුත් කිරීමෙන් පසු අලුත් භාරකරුවකු පත් කිරීමෙන් ප්‍රතියෝජනය කර ඇති අවස්ථාවක, අලුත් භාරකරු කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන තෙක්, එම බලපත්‍රය දිගට ම වලංගුව සහ බලාත්මකව පවතින්නේ යයි සැලකිය යුතු ය.".

31ආ අලුත් වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියෙහි ඇතුළත් කිරීම.

**22.** 31අ වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 31ආ වගන්තිය වශයෙන් බලාත්මක විය යුතු ය :—

"භාරකරුවකුට දී ඇති අනුමැතිය ඉවත් කර ගැනීම.

31ආ. (1)(අ) ඒකක භාරයක භාරකරු මේ පනතේ යම් විධිවිධානයක් හෝ එය යටතේ සාදන ලද යම් රීතියක් හෝ නියෝගයක් උල්ලංඝනය වන ආකාරයට ක්‍රියා කර ඇති බවට ;

(ආ) ඒකක භාරයක භාරකරු යහපත් ආර්ථික ස්ථාවරයක් දැරීම නතර වී ඇති බවට ; හෝ

(ඇ) ඒකක භාරයක භාරකරු සිය කටයුතු කළමනාකරණය කිරීමේ දී, අයථා ක්‍රියා හෝ අක්‍රමිකතා හෝ සම්බන්ධයෙන් වරදකරු වී ඇති බවට,

කොමිෂන් සභාව සෑහීමට පත් වන අවස්ථාවක දී, එම ඒකක භාරයේ භාරකරුට දී ඇති අනුමැතිය කොමිෂන් සභාව විසින් ඉවත් කර ගනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ අනුමතිය ඉවත් කර ගැනීමකින් පසු භාරකරු විශ්‍රාම ගත් ලෙස සලකනු ලැබිය යුතු නමුත් ඒ විශ්‍රාම ගැනීම කොමිෂන් සභාව විසින් නිසි ලෙස අනුමත කරන ලද අලුත් භාරකරුවකු පත් කරන තෙක් ක්‍රියාත්මක නොවිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 31ඇ වගන්තිය සංශෝධනය කිරීම.

**23.** ප්‍රධාන ප්‍රඥප්තියේ 31ඇ වගන්තිය, එහි "31අ වගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද ඉල්ලුම් පත්‍රයක් ලැබුණු විට, කොමිෂන් සභාව", යන වචන වෙනුවට "31 වන වගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද ඉල්ලුම් පත්‍රයක් ලැබුණු විට, කොමිෂන් සභාව" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

24. ප්‍රධාන ප්‍රඥප්තියේ 31ඇ වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 31ඇ වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1), (2), (3) සහ (4) වන උපවගන්ති ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්ති ආදේශ කිරීමෙන් :—

"(1) යම් ඒකක භාරයක් වෙනුවෙන්, කළමනාකරණ සමාගමක් වෙත ප්‍රදානය කරන ලද බලපත්‍රයක් —

(අ) එම ඒකක භාරයේ කළමනාකරණ සමාගම මේ පනතේ යම් විධිවිධානයක් හෝ ඒ යටතේ සාදන ලද යම් රීතියක් හෝ නියෝගයක් උල්ලංඝනය වන ආකාරයට ක්‍රියා කර ඇති බවට ;

(ආ) එම ඒකක භාරයේ කළමනාකරණ සමාගම යහපත් ආර්ථික ස්ථාවරයක් දැරීම නතර වී ඇති බවට ;

(ඇ) එම ඒකක භාරයේ කළමනාකරණ සමාගම එහි කටයුතු කළමනාකරණය කිරීමේ දී, අයථා ක්‍රියා හෝ අක්‍රමිකතා හෝ සම්බන්ධයෙන් වරදකරු වී ඇති බවට ;

(ඈ) එම ඒකක භාරයේ භාරකරු විසින් ඒ ඒකක භාරයේ කළමනාකරණ සමාගම පහ කරනු ලැබ ඇති බවට ; හෝ

(ඉ) එම ඒකක භාරයේ භාරකරුට ප්‍රදානය කරන ලද අනුමතය, 31ආ වගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් ඉවත් කර ගනු ලැබ, අලුත් භාරකරුවකු කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබ නොමැති බවට,

කොමිෂන් සභාව සෑහීමට පත් වන අවස්ථාවක දී, කොමිෂන් සභාව විසින් එම බලපත්‍රය අවලංගු කිරීම හෝ අත්හිටුවීම හෝ කරනු ලැබිය යුතු ය.

(2) යම් ඒකක භාරයක් වෙනුවෙන් කළමනාකරණ සමාගමක් වෙත ප්‍රදානය කරන ලද බලපත්‍රයක්, ඉහත උපවගන්තිය ප්‍රකාරව අවලංගු කිරීමට පෙර, ඒ බලපත්‍රය අවලංගු නොකළ යුත්තේ මන්ද යන්න පිළිබඳව හේතු දැක්වීමට අවස්ථාවක් එම කළමනාකරණ සමාගමට ලබා දිය යුතු ය.

(3) යම් ඒකක භාරයක් වෙනුවෙන් කළමනාකරණ සමාගමක් වෙත ප්‍රදානය කරන ලද බලපත්‍රයක් අවලංගු කරනු ලැබූ අවස්ථාවක දී, තම බලපත්‍රය වහාම කොමිෂන් සභාව වෙත ආපසු භාර දීම එම කළමනාකරණ සමාගමේ කාර්යය විය යුතු ය.

(4) යම් ඒකක භාරයක කළමනාකරණ සමාගමක් විසින් (1) වන උපවගන්තියේ (අ), (ආ) හෝ (ඇ) යන ඡේදවල විධිවිධාන උල්ලංඝනය කර ඇති බවට සහ එම උල්ලංඝනය කිරීම බරපතල උල්ලංඝනය කිරීමක් නොවන බවට කොමිෂන් සභාව සෑහීමට පත් වන අවස්ථාවක දී, කොමිෂන් සභාව විසින් (1) වන උපවගන්තිය යටතේ ක්‍රියා කිරීම වෙනුවට,

(අ) එම උල්ලංඝනය කිරීමේ ප්‍රතිඵලයෙන් ඇති වූ තත්වය නිවැරදි කිරීම හෝ හරිගැස්සීම සඳහා ; හෝ

(ආ) මේ පනතේ විධිවිධාන අනුව හෝ මේ පනත යටතේ සාදන ලද කිසියම් රීතියක් හෝ නියෝගයක් අනුව ක්‍රියා කිරීම සඳහා නැතහොත් එම උල්ලංඝනය කිරීම තව දුරටත් සිදු කර ගෙන යාමෙන් වැළකී සිටීම සඳහා.

සුදුසු යයි කොමිෂන් සභාව සලකන යම් ක්‍රියාමාර්ගයක් ගන්නා ලෙස එම කළමනාකරණ සමාගමට විධාන කරනු ලැබිය හැකි ය.''

(2) එම වගන්තියේ (5) වන උපවගන්තියේ "භාරකරුවකු හෝ කළමනාකරණ සමාගමක්" යන වචන සහ "භාරකරුට හෝ කළමනාකරණ සමාගමට" යන වචන යෙදී ඇති සෑම තැනක ම, එම වචන වෙනුවට පිළිවෙළින් "කළමනාකරණ සමාගමක්" සහ "කළමනාකරණ සමාගමට" යන වචන ආදේශ කිරීමෙන් ;

(3) එම වගන්තියේ පැති සටහන වෙනුවට පහත දැක්වෙන පැති සටහන ආදේශ කිරීමෙන් :—

"කළමනාකරණ සමාගමකට ප්‍රදානය කරන ලද බලපත්‍රයක් අවලංගු කිරීම."

**25.** ප්‍රධාන ප්‍රඥප්තියේ 31ඉ වගන්තිය, පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

ප්‍රධාන ප්‍රඥප්තියේ 31ඉ වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :-

"(1) කොමිෂන් සභාව විසින්-

(අ) 31ඈ වගන්තිය යටතේ බලපත්‍රයක් ප්‍රදානය කිරීම ප්‍රතික්ෂේප කරනු ලැබීමේ තීරණයකින් ; හෝ

(ආ) 31ඈ වගන්තිය යටතේ බලපත්‍රයක් අවලංගු කිරීමේ හෝ අත්හිටුවනු ලැබීමේ තීරණයකින්,

අතෘප්තියට පත් කවර හෝ තැනැත්තකු විසින්, ඒ තීරණයට විරුද්ධව, එකී තීරණය ඒ තැනැත්තා වෙත දැනුම් දෙනු ලැබූ දින සිට දින දහහතරක් ඇතුළත, අභියාචනාධිකරණය වෙත අභියාචනයක් කරනු ලැබිය හැකි ය.":

(2) ඒ වගන්තියේ (2) වන සහ (3) වන උපවගන්ති ඉවත් කිරීමෙන් ;

(3) ඒ වගන්තියේ (4) වන හා (5) වන උපවගන්ති එහි (2) වන හා (3) වන උපවගන්ති ලෙස නැවත අංක යෙදීමෙන් ; සහ

(4) ඒ වගන්තියේ නැවත අංක යෙදූ (3) වන උපවගන්තියේ "අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා කළ තීරණය" යන වචන වෙනුවට "කොමිෂන් සභාවේ තීරණය" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 31ඊ වගන්තිය සංශෝධනය කිරීම.

**26.** ප්‍රධාන ප්‍රඥප්තියේ 31ඊ වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "බලපත්‍ර ලත් ඒකක භාරයක" යන වචන වෙනුවට "ඒකක භාරයකට අදාළ" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ "බලපත්‍ර ලත් ඒකක භාරයක" යන වචන වෙනුවට "ඒකක භාරයක" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 31උ වගන්තිය සංශෝධනය කිරීම.

**27.** ප්‍රධාන ප්‍රඥප්තියේ 31උ වගන්තියේ "තැනැත්තකු" සහ "තැනැත්තාගේ" යන වචන වෙනුවට පිළිවෙලින් "කළමනාකරණ සමාගමක්" සහ "කළමනාකරණ සමාගමේ" යන වචන ද, "තම" යන වචනය වෙනුවට "ස්වකීය" යන වචනය ද ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 31ඌ වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**28.** ප්‍රධාන ප්‍රඥප්තියේ 31ඌ වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

""ඒකක භාරය" යන වචන භාවිත කිරීම සීමා කිරීම.

31ඌ. කිසිම තැනැත්තකු විසින් 31ඇ වගන්තිය යටතේ ඒකක භාරයක් පවත්වා ගෙන යාමට එම තැනැත්තාට අවසර ලැබී ඇත්නම් මිස, "ඒකක භාරය" යන වචන භාවිත කරනු නොලැබිය යුතු ය.".

29. ප්‍රධාන ප්‍රඥප්තියේ 31ඒ වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 31ඒ වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"ඒකක භාරයක ආයෝජනය කරන ලෙස ආරාධනා කරමින් දැන්වීම් නිකුත් කිරීම සීමා කිරීම.

31ඒ. කිසිම තැනැත්තකු විසින්, ඒකක භාරයක ඒකකවල ආයෝජනය කරන ලෙස මහජනතාවට ආරාධනය කරමින් කරුණු පැහැදිලි කිරීමේ සංදේශයක් හෝ දැන්වීමක් නිකුත් කිරීම හෝ පළ කිරීම නැතහොත් නිකුත් කිරීමට හෝ පළ කිරීමට සැලැස්වීම, එම තැනැත්තා ඒ ඒකක භාරයේ කළමනාකරණ සමාගමක් ලෙස බලපත්‍ර ලබා ඇත්නම් සහ එම කරුණු පැහැදිලි කිරීමේ සංදේශයේ හෝ දැන්වීමේ අඩංගු කරුණු සම්බන්ධයෙන් සහ එසේ නිකුත් කිරීම හෝ පළ කිරීම සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ පූර්ව අනුමතය ලබා ඇත්නම් මිස, කරනු නොලැබිය යුතු ය.".

30. ප්‍රධාන ප්‍රඥප්තියේ 31ඒ වගන්තියේ "බලපත්‍ර ලත් ඒකක භාරයක" යන වචන වෙනුවට "ඒකක භාරයක" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 31ඒ වගන්තිය සංශෝධනය කිරීම.

31. 33 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 33අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය :—

ප්‍රධාන ප්‍රඥප්තියට 33අ වගන්තිය අලුතින් ඇතුළත් කිරීම.

"මේ කොටස යටතේ වූ වැරදි.

33අ. මේ පනතේ මේ කොටසේ යම් විධිවිධානයක් කඩ කරන යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් දස ලක්ෂයකට නොඅඩු දඩයකට හෝ අවුරුදු දෙකකට නො අඩු හා අවුරුදු පහකට නොවැඩි කාලයක් සඳහා දෙආකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම හා දඩය යන දෙකට ම හෝ යටත් විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තිය සංශෝධනය කිරීම.

**32.** ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ උපවගන්තියේ (ආ) ඡේදයේ "බලාපොරොත්තු විය හැකි නම්" යන වචන වෙනුවට "බලාපොරොත්තු විය හැකි නම් ; හෝ" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) ඒ උපවගන්තියේ (ආ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්,

"(ඇ) ලැයිස්තුගත සුරැකුම්පත් සම්බන්ධව වූ ද පළ නොකළ මිල සංවේදී තොරතුරු බව ඔහු දන්නා වූ ද, ඔහුගේ කාර්ය ඉටු කිරීමේ දී හැර ඔහු විසින් අනාවරණය නොකරනු ඇතැයි බලාපොරොත්තු වීම සාධාරණ වන්නා වූ ද, තොරතුරුවලට ඔහුට ප්‍රවේශය ඇති බව,".

ප්‍රධාන ප්‍රඥප්තියේ 35 වන වගන්තිය සංශෝධනය කිරීම.

**33.** 1991 අංක 26 දරන පනතින් සංශෝධිත පරිදි වූ ප්‍රධාන ප්‍රඥප්තියේ 35 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදයේ "15 වන වගන්තිය, 20 වන වගන්තිය සහ 31අ වගන්තිය" යන වචන හා ඉලක්කම් වෙනුවට "15 වන වගන්තිය, 19අ වගන්තිය, 20 වන වගන්තිය සහ 31වන වගන්තිය" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්, එම වගන්තිය මෙයින් තව දුරටත් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තිය සංශෝධනය කිරීම.

**34.** 1991 අංක 26 දරන පනතින් සංශෝධිත පරිදි වූ, ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තව දුරටත් සංශෝධනය කරනු ලැබේ :—

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ "බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු වෙළෙන්දකු හෝ බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු තැරැව්කරුවකු සිය ගිවිසුම් බැඳීම් ඉටු කිරීමට අසමත් වීම හේතු කොට ගෙන" යන වචන වෙනුවට "යම් බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු තැරැව්කරුවකු හෝ බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු වෙළෙන්දකු සිය ගිවිසුම්ගත බැඳීම් ඉටු කිරීමට අපොහොසත් වීමේ ප්‍රතිඵලයක් වශයෙන්" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) එම වගන්තියේ (2) වන උපවගන්තිය :—

(අ) ඒ උපවගන්තියේ (ආ) ඡේදයේ "මුදල් ප්‍රමාණවලින්" යන වචන වෙනුවට "මුදල් ප්‍රමාණවලින් ;" යන වචන ආදේශ කිරීමෙන් : සහ

(ආ) ඒ උපවගන්තියේ (ආ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන් :—

"(ඇ) 14ආ වගන්තිය යටතේ සෙස් බදු අරමුදලින් බැර කරනු ලැබිය හැකි මුදල් ගණන්,".

ප්‍රධාන ප්‍රඥප්තියේ 40 වන වගන්තිය සංශෝධනය කිරීම.

**35.** ප්‍රධාන ප්‍රඥප්තියේ 40 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "යම් බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු වෙළෙන්දකු හෝ බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු තැරැව්කරුවකු අසමත් වීම හේතු කොට ගෙන" යන වචන වෙනුවට "යම් බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු වෙළෙන්දකු හෝ බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු තැරැව්කරුවකු අපොහොසත් බවට තීරණය කරනු ලැබීමේ ප්‍රතිඵලයක් වශයෙන්" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 45 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**36.** ප්‍රධාන ප්‍රඥප්තියේ 45 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"ලේඛන ඉදිරිපත් කිරීම සහ තොරතුරු අනාවරණය කිරීම.

45. (1) කොමිෂන් සභාව හෝ කොමිෂන් සභාව විසින් තත් කාර්ය සඳහා බලය දෙන ලද නැනැත්තකු විසින්, ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින් දැන්වීමේ නිශ්චිතව සඳහන් කාලසීමාවක් ඇතුළත (යම් බද්දක් පැනවීම සහ අය කර ගැනීම සඳහා විධිවිධාන සලස්වන යම් නීතියක් යටතේ අනාවරණය කිරීමට හෝ ඉදිරිපත් කිරීමට තහනම් කර ඇති තොරතුරක් හෝ ලේඛනයක් හැර) මේ පනත යටතේ කොමිෂන් සභාවේ බලතල නිසි ලෙස ක්‍රියාත්මක කිරීම හෝ එහි කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය යයි කොමිෂන් සභාව විසින් අදහස් කරනු ලබන දැන්වීමේ නිශ්චිතව සඳහන් යම් තොරතුරු සපයන ලෙස හෝ යම් ලේඛනයක් ඉදිරිපත් කරන ලෙස යම් නැනැත්තකුට නියම කළ හැකි ය.

(2) යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් ව ඇත ද, දැන්වීමේ නිශ්චිතව සඳහන් කාලසීමාව ඇතුළත එම දැන්වීමේ නියමයන්ට අනුකූලව කටයුතු කිරීම (1) වන උපවගන්තිය යටතේ දැන්වීමක් ලබන යම් නැනැත්තකුගේ කාර්යය විය යුතු ය. එවැනි දැන්වීමක් අනුව ක්‍රියා කරමින් එම නැනැත්තා යම් ලිඛිත නීතියක් යටතේ හෙළි කිරීම හෝ ඉදිරිපත් කිරීම තහනම් කර ඇති යම් තොරතුරක් හෙළි කරන හෝ යම් ලේඛනයක් ඉදිරිපත් කරන අවස්ථාවක, එම ලිඛිත නීතියේ පටහැනිව කුමක්

සඳහන්ව ඇත ද, එම හෙළි කිරීම හෝ ඉදිරිපත් කිරීම එම ලිඛිත නීතියේ විධිවිධාන උල්ලංඝනය කිරීමක් ලෙස සලකනු නොලැබිය යුතු ය.

(3) මේ වගන්තිය යටතේ නිකුත් කරන ලද දැන්වීමකට අනුකූලව ක්‍රියා කරමින් සපයන ලද තොරතුරක් හෝ ඉදිරිපත් කරන ලද ලේඛනයක අඩංගු දේ අවස්ථාවෝචිත පරිදි, එම තොරතුරු සපයන හෝ එම ලේඛනය ඉදිරිපත් කරන තැනැත්තාගේ කැමැත්ත ඇතිව හෝ කොමිෂන් සභාවේ කර්තව්‍ය ඉටු කිරීමේ දී හැර, පළ කිරීම හෝ වෙනත් යම් තැනැත්තකුට දැනුම් දීම නොකළ යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වන වගන්තිය සංශෝධනය කිරීම.

**37.** 1991 අංක 26 දරන පනතින් සංශෝධිත පරිදි වූ, ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වන වගන්තිය පහත දැක්වෙන පරිදි තව දුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එම වගන්තියේ (1) වන, (2) වන සහ (3) වන උපවගන්ති ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්ති ආදේශ කිරීමෙන් :—

"(1) (අ) යම් බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක හෝ ඒ විනිමය ස්ථානයේ යම් බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු තැරැව්කරුවකුගේ හෝ බලපත්‍රලත් ව්‍යාපාර වස්තු වෙළෙන්දකුගේ හෝ යම් ලැයිස්තු ගත පොදු සමාගමක හෝ යම් ඒකක භාරයක බලපත්‍ර ලත් කළමනාකරණ සමාගමක හෝ භාරකරුවකුගේ හෝ ලියාපදිංචි වෙළෙඳපොල අතරමැදියකුගේ වෘත්තීය පැවැත්ම හෝ කටයුතු පිළිබඳව යම් තැනැත්තකු විසින් කරනු ලබන පැමිණිලි ;

(ආ) යම් බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු තැරැව්කරුවකු හෝ ව්‍යාපාර වස්තු වෙළෙන්දකු විසින්, ඒ ව්‍යාපාර වස්තු තැරැව්කරු හෝ ව්‍යාපාර වස්තු වෙළෙන්දා සාමාජිකයකු වන බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයේ වෘත්තීය පැවැත්ම හෝ කටයුතු පිළිබඳව කරන පැමිණිලි ;

(ඇ) විභාග කර තීරණය කිරීම සඳහා කොමිෂන් සභාව විසින් කමිටුව වෙත යොමු කරනු ලබන යම් කාරණයක්,

පිළිබඳව විභාග කර තීරණය කිරීම සඳහා කොමිෂන් සභාව විසින් කොමිෂන් සභාවේ සාමාජිකයන් තිදෙනකුගෙන් සමන්විත කමිටුවක් පිහිටුවනු ලැබිය හැකි ය.

(2) යම් තැනැත්තකු හෝ බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු තැරැව්කරුවකු හෝ බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු වෙළෙන්දකු හෝ විසින් කරන ලද ලිඛිත පැමිණිල්ලක් කමිටුව වෙත ලැබුණු විට ඒ පැමිණිල්ල සනාථ කිරීම සඳහා යම් ලියවිලි හෝ වෙනත් සාක්ෂි ඉදිරිපත් කර ඇත්නම්, ඒවා පරීක්ෂා කර බලා, අවස්ථාවෝචිත පරිදි එම බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය හෝ බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු තැරැව්කරු හෝ බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු වෙළෙන්දා හෝ ලැයිස්තුගත පොදු සමාගම හෝ එම ඒකක භාරයේ බලපත්‍ර ලත් කළමනාකරණ සමාගම හෝ භාරකරු හෝ ලියාපදිංචි වෙළෙඳපොළ අතරමැදියා හෝ විසින්, මේ පනතේ යම් විධිවිධානයක් හෝ මේ පනත යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ රීතියක් උල්ලංඝනය කර තිබේ ද යන වග හෝ එම බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයේ යම් රීතියක් උල්ලංඝනය කර තිබේ ද යන වග ඒ කමිටුව විසින් අවස්ථාවෝචිත පරිදි තීරණය කරනු ලැබිය හැකි ය. එම බලපත්‍ර ලත් විනිමය ස්ථානයට හෝ බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු තැරැව්කරුට හෝ බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු වෙළෙන්දාට හෝ ලැයිස්තුගත පොදු සමාගමට හෝ එම කළමනාකරණ සමාගමට හෝ භාරකරුට හෝ ලියාපදිංචි වෙළෙඳපොල අතරමැදියාට කරුණු පැහැදිලි කිරීමේ අවස්ථාවක් ලබා නොදී, එවැනි තීරණයක් කරනු නොලැබිය යුතු ය.

(3) අවස්ථාවෝචිත පරිදි, බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක්, බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු තැරැව්කරුවකු, බලපත්‍ර ලත්

ව්‍යාපාර වස්තු වෙළෙන්දකු, ලැයිස්තුගත පොදු සමාගමක්, ඒකක භාරයක බලපත්‍ර ලත් කළමනාකරණ සමාගමක් හෝ භාරකරුවකු හෝ ලියාපදිංචි වෙළෙඳපොල අතරමැදියකු විසින් මේ පනතේ විධිවිධාන හෝ මේ පනත යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ රීතියක් හෝ උල්ලංඝනය කර ඇති බව හෝ ඒ බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයේ යම් රීතියක් උල්ලංඝනය කර ඇති බව කමිටුව විසින් තීරණය කරනු ලබන අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි, ඒ බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයට, බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු තැරැව්කරුට, බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු වෙළෙන්දාට, ලැයිස්තු ගත පොදු සමාගමට හෝ කළමනාකරණ සමාගමට හෝ භාරකරුට හෝ වෙළෙඳපොල අතරමැදියාට විරුද්ධව ගත යුතු ක්‍රියාමාර්ගයේ ස්වභාවය කමිටුව විසින් කොමිෂන් සභාව වෙත නිර්දේශ කළ යුතු ය. එම නිර්දේශ ක්‍රියාත්මක කිරීම පිණිස උචිත ක්‍රියාමාර්ගයක් ගැනීම හෝ තව දුරටත් කාරණය ගැන විමර්ශනය කිරීම සඳහා එය උචිත බලධරයා වෙත යොමු කිරීම අරභයා ස්වකීය අභිමතය පරිදි ක්‍රියා කිරීමට කොමිෂන් සභාවට අභිමතය තිබිය යුතු ය.''

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :-

''(3අ) මේ වගන්තියේ ඉහතින් ම වූ විධිවිධාන කුමක් වුව ද, කොමිෂන් සභාව විසින් ඒ වෙත යොමු කරනු ලබන යම් කාරණයක් ගැන පරීක්ෂා කර බැලීමට සහ ඒ පරීක්ෂණය අවසන් කිරීමෙන් පසු ඒ කාරණයට අදාළව ගනු ලැබිය යුතු ක්‍රියාමාර්ගයේ ස්වභාවය කොමිෂන් සභාව වෙත නිර්දේශ කිරීමට ද කමිටුවට බලය තිබිය යුතු ය.''; සහ

(3) ඒ වගන්තියේ (4) වන උපවගන්තියේ ''(3) වන උපවගන්තිය යටතේ'' යන වචන හා ඉලක්කම් වෙනුවට ''අවස්ථාවෝචිත පරිදි, (3) වන උපවගන්තිය හෝ (3අ) උපවගන්තිය යටතේ'' යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්.

**38.** 46 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 46අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය :—

46අ අලුත් වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියෙහි ඇතුළත් කිරීම.

"පරීක්ෂණ සහ විමර්ශන.

46අ. (1) කොමිෂන් සභාව හෝ කොමිෂන් සභාව විසින් තත් කාර්යය සඳහා යථා පරිදි බලය දෙන ලද යම් තැනැත්තකු විසින්, මේ පනත යටතේ වූ කොමිෂන් සභාවේ බලතල, කාර්ය හා කර්තව්‍ය කිසිවක් ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම හා කිරීම සඳහා අවශ්‍ය යයි හෝ යෝග්‍ය යයි කොමිෂන් සභාව හෝ ඒ තැනැත්තා විසින් සලකනු ලබන යම් විමර්ශන කිරීම හෝ පරීක්ෂණ පැවැත්වීම කරනු ලැබිය හැකි අතර, තත් කාර්යය සඳහා, ඒ විමර්ශනයේ හෝ පරීක්ෂණයේ කාර්ය සඳහා අවශ්‍යවන පරිදි සාක්ෂි දීම පිණිස හෝ යම් තැනැත්තකුගේ සන්තකයේ හෝ පාලනයේ ඇති පොත්පත් හෝ ලේඛන කිසිවක් ඉදිරිපත් කිරීම පිණිස කොමිෂන් සභාව හෝ ඒ බලය දෙන තැනැත්තා ඉදිරියෙහි පෙනී සිටින ලෙස කැඳවීම හා එසේ ඉදිරිපත් කරන ලෙස නියම කිරීම කළ හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ විමර්ශනයක් හෝ පරීක්ෂණයක් කර ගෙන යාමේ කාර්යය සඳහා බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක හෝ යම් බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු තැරැව්කරුවකුගේ හෝ යම් බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු වෙළෙන්දකුගේ හෝ යම් ලැයිස්තුගත පොදු සමාගමක හෝ යම් ඒකක භාරයක බලපත්‍ර ලත් කළමනාකරණ සමාගමක හෝ ලියාපදිංචි වෙළෙඳපොළ අතරමැදියකුගේ යම් පරිශ්‍රයකට දවසේ ඕනෑම සාධාරණ වේලාවක් හි දී ඇතුළු වී මේ පනත යටතේ හෝ මේ පනත යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ රීතියක් යටතේ නැතහොත් වෙනත් යම් නීතියක් යටතේ හෝ ඒ ව්‍යාපාරය සම්බන්ධයෙන් තබා ගත යුතු බවට නියම කරනු ලැබ ඇති යම් ලේඛන පරීක්ෂා කිරීමට හා ඒවායේ පිටපත් ගැනීමට, කොමිෂන් සභාව විසින් යම් නිලධරයකුට ලියවිල්ලකින් බලය දිය හැකි ය.

(3) කොමිෂන් සභාව හෝ (1) වන උපවගන්තිය යටතේ තත් කාර්යය සඳහා නිසි ලෙස බලය දෙන ලද යම් තැනැත්තකු ඉදිරියෙහි පෙනී සිටින ලෙස කැඳවනු ලැබූ හෝ නියම කරනු ලැබූ යම් තැනැත්තකු වාචිකව පරීක්ෂා කර බලනු ලැබිය හැකි අතර, එසේ පරීක්ෂා කරනු ලැබූ තැනැත්තා විසින් කරන ලද යම් ප්‍රකාශයක්, ලියවිල්ලක් බවට පත් කළ හැකි ය. ලියවිල්ලක් බවට පත් කරන ලද එවැනි සෑම ප්‍රකාශයක් ම එසේ පරීක්ෂා කිරීමට යෙදුනු තැනැත්තා විසින් අත්සන් කරනු ලැබිය යුතු ය. එසේ වුව ද, ඒ ප්‍රකාශය අත්සන් කිරීමට පෙරාතුව එම තැනැත්තාට ඒ ප්‍රකාශය පෙන්වීම හෝ කියවා දීම නැතහොත් එය ලියා ඇති භාෂාව ඔහුට තේරුම් ගත නොහැකි නම්, ඔහුට තේරුම් ගත හැකි භාෂාවකින් එය භාෂණ පරිවර්තන කර දිය යුතු අතර ඒ ප්‍රකාශය පැහැදිලි කිරීමට හෝ ඊට කිසිවක් එකතු කිරීමට ඔහුට නිදහස ඇත්තේ ය.

(4) (1) වන උපවගන්තිය යටතේ අවස්ථාවෝචිත පරිදි කොමිෂන් සභාව හෝ බලය දෙන ලද තැනැත්තා ඉදිරියෙහි පෙනී සිටින ලෙස යම් තැනැත්තකුට නියම කරනු ලැබූ විට, එසේ කිරීම පැහැර හරිනු ලැබූ සෑම තැනැත්තකු ම හෝ කොමිෂන් සභාව විසින් හෝ කොමිෂන් සභාව විසින් නිසි ලෙස බලය දෙන ලද තැනැත්තකු විසින් ඔහුගෙන් අසනු ලබන යම් ප්‍රශ්නයකට උත්තර දීම ප්‍රතික්ෂේප කරන තැනැත්තකු හෝ තම සන්තකයේ හෝ පාලනයේ ඇති යම් පොතක් හෝ ලේඛනයක් ඉදිරිපත් කරන ලෙස නියම කරනු ලැබූ විට, එසේ ඉදිරිපත් කිරීම ප්‍රතික්ෂේප කරන හෝ කොමිෂන් සභාව විසින් හෝ කොමිෂන් සභාව විසින් නිසි ලෙස බලය දෙන ලද තැනැත්තකු විසින් අසන ලද යම් ප්‍රශ්නයකට දැන දැන ම අසත්‍ය උත්තරයක් දෙන තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, අවුරුදු පහක් නොඉක්මවන කාලයක් සඳහා

දෙයාකාරයෙන් එක් ආකාරයකින් බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් දස ලක්ෂයක් නොඉක්මවන දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය.''.

**39.** ප්‍රධාන ප්‍රඥප්තියේ 47 වන වගන්තියේ ''දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව'' යන වචන වෙනුවට ''දණ්ඩ නීති සංග්‍රහයේ සහ 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ අර්ථානුකූලව'' යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 47 වන වගන්තිය සංශෝධනය කිරීම.

**40.** 50 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 50අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය :-

ප්‍රධාන ප්‍රඥප්තියේ 50අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

කොමිෂන් සභාවේ සාමාජිකයන්ට තර්ජනය කිරීම, බියගැන්වීම හෝ අපහාස කිරීම යනාදිය.

50අ. කොමිෂන් සභාවේ යම් සාමාජිකයකු, අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ කොමිෂන් සභාවේ වෙනත් යම් නිලධරයකු හෝ සේවකයකු මේ පනත යටතේ හෝ මේ පනත යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ රීතියක් යටතේ ඔහුගේ කාර්ය කර ගෙන යාමේ දී,-

(අ) ඔහුට තර්ජනය කරන හෝ ඔහු බියගන්වන ; හෝ

(ආ) ඔහු අපකීර්තියට පත් කිරීමේ හෝ ඔහුගේ කීර්තියට අපහාස කිරීමේ අදහසින් යම් අවමන් සහගත ප්‍රකාශයක් කරන හෝ එවැනි ප්‍රකාශයක් පළ කරන,

යම් තැනැත්තෙක් හෝ පුද්ගල මණ්ඩලයක් වරදකට වරදකරුවන අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් පණස් දහසක් නො ඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයකට දෙආකාරයෙන් එක් ආකාරයකින් බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමයකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දෙකටම හෝ යටත් විය යුතු ය.''.

ප්‍රධාන ප්‍රඥප්තියේ 51 වන වගන්තිය සංශෝධනය කිරීම.

**41.** 1991 අංක 26 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 51 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තව දුරටත් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(ආ) මේ පනතේ හෝ මේ පනතේ විධිවිධාන යටතේ පනවන ලද යම් නියමයන් හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක හෝ යම් රීතියක කාර්ය සඳහා, තමාගේ දැනුම අනුව අසත්‍ය, සාවද්‍ය හෝ නොමග යවන සුළු යම් තොරතුරක් සපයන හෝ අසත්‍ය, සාවද්‍ය හෝ එසේ නොමග යවන සුළු කරුණු ඇතුළත් යම් වාර්තාවක්, ලේඛනයක් හෝ ප්‍රකාශයක් ඉදිරිපත් කරන : හෝ ";

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ "වරදකට වරදකරු වන" යන වචනවල සිට ඒ උපවගන්තියේ අවසානය දක්වා වූ සියලු වචන වෙනුවට, "වරදකට වරදකරු වන යම් තැනැත්තකු, මහෙස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, අවුරුදු පහක් නොඉක්මවන කාලයක් සඳහා දෙආකාරයෙන් එක් ආකාරයකින් බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ රුපියල් පනස් දහසකට නො අඩු සහ ලක්ෂ සියයක් නොඉක්මවන දඩයකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ ;

(3) ඒ වගන්තියේ (2) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් :—

"(3) මේ පනත යටතේ වූ යම් වරදක් සංස්ථාවක් විසින් සිදු කරනු ලැබ ඇති අවස්ථාවක දී, ඒ වරද සිදු කරන ලද්දේ තමාගේ දැනුම හෝ අනුදැනුම ඇතිව නොවන බවත් ඒ වරද සිදු කිරීම වැළැක්වීම සඳහා, ඔහුගේ කර්තව්‍යවල ස්වභාවය ගැන සහ කාරණයෙහි

සියලු අවස්ථානුකූල කරුණු ගැන සැලකිල්ල ඇතිව ඒ වරද සිදු කිරීම වැළැක්වීම සඳහා අවශ්‍ය නිසි උද්යෝගයෙන් තමා ක්‍රියා කළ බවත් ඔප්පු කරන්නේ නම් මිස, ඒ වරද සිදු කළ අවස්ථාවේ දී ඒ සංස්ථාවේ අධ්‍යක්ෂවරයකු වූ, කළමනාකරුවකු, ලේකම් හෝ එවැනි වෙනත් නිලධරයකුව සිටි සෑම තැනැත්තෙක් ම ඒ වරදට වරදකරුවෙක් වන ලෙස සලකනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 53 වන වගන්තිය සංශෝධනය කිරීම.

**42.** 1991 අංක 26 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 53 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ උපවගන්තියේ (අ) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(අ) බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක සුරැකුම්පත් ලැයිස්තුගත පොදු සමාගම් විසින් හිමිකම් හෝ ප්‍රසාද නිකුත් කිරීමෙන් හෝ අන්‍යාකාරයකින් යම් අතිරේක සුරැකුම්පත් නිකුත් කිරීම ;";

(2) ඒ උපවගන්තියේ (ආ) ඡේදයෙහි "බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු තැරැව්කරුවන් සහ ව්‍යාපාර වස්තු වෙළෙන්දන් විසින් කොටස් ගනුදෙනු සම්බන්ධයෙන් හා බලපත්‍ර ලත් ඒකක භාරයක ඒකකවලට අදාළ ගනුදෙනු සම්බන්ධයෙන්" යන වචන වෙනුවට "බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු තැරැව්කරුවන් සහ බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු වෙළෙන්දන් විසින් සුරැකුම්පත් සම්බන්ධයෙන් හා ඒකක භාරයක ඒකකවලට අදාළ ගනුදෙනු සම්බන්ධයෙන්" යන වචන ආදේශ කිරීමෙන් ;

(3) ඒ උපවගන්තියේ (ඇ) ඡේදය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(ඇ) බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක් හෝ බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු තැරැව්කරුවකු හෝ බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු වෙළෙන්දකු විසින් හෝ ඒකක භාරයක බලපත්‍ර ලත් කළමනාකරණ සමාගමක් හෝ ලියාපදිංචි වෙළෙඳපොළ අතරමැදියකු විසින් පොත්, වාර්තා,

ගිණුම් සහ විගණන නිසි ලෙස පවත්වා ගෙන යාම සහ ඒ බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය, බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු තැරැව්කරුවකු හෝ බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු වෙළෙන්දා, හෝ බලපත්‍ර ලත් කළමනාකරණ සමාගම හෝ ලියාපදිංචි වෙළෙඳපොල අතරමැදියා විසින් ස්වකීය කටයුතු පිළිබඳ කොමිෂන් සභාව වෙත නිතිපතා වාර්තා කිරීම ;";

(4) ඒ උපවගන්තියේ (ඇ) ඡේදයේ "බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු තැරැව්කරුවකු හා ව්‍යාපාර වස්තු වෙළෙන්දකු සහ බලපත්‍ර ලත් ඒකක භාරයක කළමනාකරණ සමාගම" යන වචන වෙනුවට "බලපත්‍රලත් ව්‍යාපාර වස්තු තැරැව්කරුවකු සහ බලපත්‍රලත් ව්‍යාපාර වස්තු වෙළෙන්දකු සහ ඒකක භාරයක බලපත්‍රලත් කළමනාකරණ සමාගම සහ ලියාපදිංචි වෙළෙඳපොල අතරමැදියකු" යන වචන ආදේශ කිරීමෙන් ;

(5) ඒ උපවගන්තියේ (ඊ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(ඊ) ඒකක භාරයක භාරකරු සහ බලපත්‍ර ලත් කළමනාකරණ සමාගම විසින් පිළිපැදිය යුතු චර්යාධර්ම සංග්‍රහයක් ;";

(6) ඒ උපවගන්තියේ (උ) ඡේදයෙහි "නියමිත කාරණා" යන වචන වෙනුවට "නියමිත කාරණා ;" යන වචන ආදේශ කිරීමෙන් ;

(7) ඒ උපවගන්තියේ (උ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේද එකතු කිරීමෙන් :—

"(ඌ) බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු තැරැව්කරුවන්, බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු වෙළෙන්දන්, ඒකක භාරයක බලපත්‍ර ලත් කළමනාකරණ සමාගම් සහ ලියාපදිංචි වෙළෙඳපොල අතරමැදියන් විසින් අනුගමනය කළ යුතු ප්‍රාග්ධන අවශ්‍යතා, කාර්ය මණ්ඩල සුදුසුකම්, ලේඛන තබා ගැනීම සහ වෙනත් ලේඛනීයකරණ ක්‍රම ;

(ඪ) බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක්, බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු තැරැව්කරුවකු, බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු වෙළෙන්දකු, ඒකක භාරයක බලපත්‍ර ලත් කළමනාකරණ සමාගමක්, ලියාපදිංචි වෙළෙඳපොළ අතරමැදියකු, ලැයිස්තුගත පොදු සමාගමක් හෝ ලැයිස්තුගත කිරීම සඳහා ඉල්ලුම් කර ඇති පොදු සමාගමක් විසින් නිකුත් කිරීමට යෝජිත ප්‍රචාරක දැන්වීම්වල ආකෘතිය සහ ඇතුළත් විය යුතු කරුණු ;

(ඬ) බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු තැරැව්කරුවකු හෝ බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු වෙළෙන්දකු හෝ ලියාපදිංචි වෙළෙඳපොළ අතරමැදියකු විසින් ආන්තික ගිණුමක සුරැකුම්පත් මෙහෙයුම ;

(ඹ) ලැයිස්තුගත සුරැකුම්පත්වලට අදාළව, ලියාපදිංචි වෙළෙඳපොළ අතරමැදියන්ගේ ව්‍යාපාරික කටයුතු සහ ක්‍රියාකාරකම් ;

(ඕ) ලැයිස්තුගත සමාගම් විසින් තොරතුරු හෙළිදරව් කිරීම හා වාර්තා කිරීම සහ තොරතුරු සැපයීම ;

(ක) බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක් වෙත කරන ලද ලැයිස්තුගත කිරීම සඳහා වූ ඉල්ලීම් ප්‍රතික්ෂේප කිරීම සහ බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක් විසින් ලැයිස්තු ගත කිරීම, අත්හිටුවීම හා අවලංගු කිරීම ; සහ

(ග) ව්‍යාපාර වස්තු ණයට දෙන්නන්ගේ සහ ව්‍යාපාර වස්තු ණයට ගන්නන්ගේ ක්‍රියාකාරකම් විධිමත් කිරීම.".

**43.** 1991 අංක 26 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 55 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තව දුරටත් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 55 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) "සම්බන්ධිත තැනැත්තා" යන යෙදුමෙහි අර්ථකථනයට පෙරාතුව ම පහත දැක්වෙන අලුත් අර්ථකථන ඇතුළත් කිරීමෙන් :—

"ප්‍රචාරක දැන්වීම" යන්නට, යම්කිසි පළකිරීමක කරනු ලබන ප්‍රචාරය කිරීමක් හෝ දැන්වීම්,

සංඥා, හෝ ලේබල් ප්‍රදර්ශනය කිරීමේ මාර්ගයෙන් හෝ චක්‍රලේඛ, කැටලොග්, මිල දර්ශක හෝ වෙනත් ලේඛන මාර්ගයෙන් හෝ පිංතූර හෝ ඡායාරූප හෝ සිනමා රූපණපට ප්‍රදර්ශනය කිරීමෙන් හෝ ගුවන් විදුලියෙන් හෝ රූපවාහිනියෙන් හෝ ශබ්ද විකාශනය මගින් හෝ පටිගත කිරීම් බෙදා හැරීමෙන් හෝ ඒ හා සමාන වෙනත් ක්‍රමයකින් කරනු ලබන ප්‍රචාරක දැන්වීම් ඇතුළත් වේ ;

"ප්‍රසාද නිකුත් කිරීම" යන්නෙන්, අර්පණය විස්තර කරනු ලබන්නේ හෝ සඳහන් කරනු ලබන්නේ කවරාකාරයකින් වුව ද, ලැයිස්තුගත පොදු සමාගමක පවත්නා යම් සුරැකුම්පත් හෝ අනාගතයේ දී නිකුත් කරනු ලැබිය හැකි සුරැකුම්පත්, ප්‍රතිෂ්ඨාවක් නොමැතිව සහ අර්පණය කරන දිනයේ දී ඔවුන් විසින් දරනු ලබන සුරැකුම්පත් ප්‍රමාණයට අනුපාතිකව, ඒ සමාගමේ දැනට සිටින සුරැකුම්පත් හිමියන් වෙත අර්පණය කිරීම අදහස් වේ :";

(2) "සම්බන්ධිත තැනැත්තා" යන යෙදුමේ අර්ථකථනයෙහි-

(අ) "ඒකක භාරයක භාරකරු හෝ කළමනාකරණ සමාගම" යන වචන වෙනුවට "ඒකක භාරයක භාරකරු හෝ බලපත්‍රලත් කළමනාකරණ සමාගම" යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) (අ) ඡේදයේ "හෝ කළමනාකරණ සමාගමේ" සහ "හෝ කළමනාකරණ සමාගමේ" යන වචන වෙනුවට පිළිවෙළින් "හෝ බලපත්‍රලත් කළමනාකරණ සමාගමේ" සහ "හෝ බලපත්‍රලත් කළමනාකරණ සමාගමේ" යන වචන ආදේශ කිරීමෙන් ;

(ඇ) එහි (ආ) ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :-

"(ආ) භාර සමාගම සහ බලපත්‍රලත් කළමනාකරණ සමාගම විසින් එක්ව

හෙළිත්ම හෝ අන්‍යාකාරයකින් යම් සමාගමක සාමාන්‍ය ප්‍රාග්ධනයෙන් යම් නියමිත ප්‍රතිශතයක හෝ ඊට වැඩි ප්‍රමාණයක අයිතිය දරන්නේ ද නැතහොත් භාර සමාගම් සහ බලපත්‍රලත් කළමනාකරණ සමාගම් විසින් යම් සමාගමක මුළු ඡන්ද සංඛ්‍යාවෙන් යම් නියමිත ප්‍රතිශතයක් හෝ ඊට වැඩි ප්‍රමාණයක හෙළිත්ම හෝ අන්‍යාකාරයකින් ප්‍රකාශ කරනු ලබන්නේ ද, එවැනි සමාගමක් ;";

(ඈ) එහි (ඇ) ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :-

"(ඇ) ඒකක භාරයක භාරකරුගේ හෝ බලපත්‍ර ලත් කළමනාකරණ සමාගමක හෝ (ආ) ඡේදයේ සඳහන් සමාගමක, අධ්‍යක්ෂවරයෙක් හෝ නිලධරයෙක්,";

(3) "සම්බන්ධිත තැනැත්තා" යන යෙදුමේ අර්ථකථනයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථකථන ඇතුළත් කිරීමෙන් :—

"ණය ප්‍රමාණීකරණ නියෝජ්‍යායතනය" යන්නෙන්, ලැයිස්තුගත කළ සුරැකුම්පත්වල හෝ ලැයිස්තුගත කිරීමට ඇති සුරැකුම්පත්වල යම් නිකුතුවක ණය පිළිබඳ සුදුසුකම්, ඒ මත නිකුත් කරන්නා වෙත පනවනු ලැබ ඇති යම් බැඳීමක් ඉටු කිරීමට නිකුත් කරන්නාගේ ඇති හැකියාව කෙරෙහි විශේෂ සැලකිල්ල ඇතිව, තක්සේරු කිරීමේ සහ ඇගයුම් කිරීමේ ව්‍යාපාරයෙහි නිරතව සිටින තැනැත්තකු අදහස් වේ ;

"ආයෝජන කළමනාකරු" යන්නෙන්, ගාස්තුවක් හෝ වට්ටමක් සඳහා, ආයෝජකයකු වෙනුවෙන් ලැයිස්තුගත සුරැකුම්පත් ආයෝජනාවලියක් කළමනාකරණය කිරීමේ ව්‍යාපාරයෙහි නිරතව

සිටින හෝ ලැයිස්තුගත සුරැකුම්පත්වල ආයෝජනය කිරීමෙහි, ඒවා මිලට ගැනීමෙහි හෝ විකිණීමෙහි යෝග්‍යතාව පිළිබඳව යම් තැනැත්තකුට උපදෙස් දෙන තැනැත්තකු අදහස් වේ ;';

(4) "ලැයිස්තුගත පොදු සමාගම" යන යෙදුමේ අර්ථකථනය සහ "ලැයිස්තුගත සුරැකුම්පත්" යන යෙදුමේ අර්ථකථනය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අර්ථකථන ආදේශ කිරීමෙන් :—

' "ලැයිස්තුගත පොදු සමාගම" යන්නෙන්, ස්වකීය සුරැකුම්පත් බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක ලැයිස්තුගත කර ඇති හෝ මිල ලැයිස්තුගත කර ඇති යම් පොදු සමාගමක් අදහස් වන අතර—

(අ) ස්වකීය සුරැකුම්පත් බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක ලැයිස්තුගත කර ඇති යම් රාජ්‍ය සංස්ථාවක් ; සහ

(ආ) (කොටස් හැර) ස්වකීය සුරැකුම්පත් බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක ලැයිස්තුගත කර ඇති යම් පුද්ගලික සමාගමක් ද,

ඊට ඇතුළත් වේ ;

"ලැයිස්තුගත සුරැකුම්පත්" යන්නෙන්, බලපත්‍රලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක ලැයිස්තුගත කර ඇති යම් සුරැකුම්පත් අදහස් වේ ;':

(5) "කළමනාකරණ සමාගම" යන යෙදුමේ අර්ථකථනයෙහි–

"බලපත්‍රලත් ඒකක භාරයක් සම්බන්ධයෙන් යෙදෙන විට" යන වචන වෙනුවට "ඒකක භාරයක් සම්බන්ධයෙන් වන විට" යන වචන ආදේශ කිරීමෙන් ;

(6) "කළමනාකරණ සමාගම" යන යෙදුමේ අර්ථකථනයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථකථන ඇතුළත් කිරීමෙන් :—

"ආන්තික ගිණුම" යන්නෙන්, ආයෝජකයකුට සුරැකුම්පත් මිලට ගැනීමට හෝ විකිණීමට ඉඩ සලසන, තැරැව්කරුවකුගේ ණය සඳහා සම පාර්ශ්වික ගිණුමක් ලෙස සාමාන්‍යයෙන් ප්‍රයෝජනයට ගැනෙන තැරැව්කාර ගිණුමක් අදහස් වේ ;

"ආන්තික සපයන්නා" යන්නෙන්, ලැයිස්තුගත පොදු සමාගමක සුරැකුම්පත් මිලට ගැනීම පිණිස ආයෝජකයන්ට ණය සපයා දීමේ ව්‍යාපාරයෙහි යෙදී සිටින තැනැත්තකු අදහස් වේ ;

"වෙළෙඳපොළ අතරමැදියා" යන්නෙන්, ප්‍රතිරක්ෂකයකු, ආන්තික සපයන්නකු, ණය ප්‍රමාණීකරණ නියෝජ්‍යායතනයක් හෝ ආයෝජන කළමනාකරුවකු අදහස් වන අතර, ඒ වෙත තැන්පත් කර ඇති සියලු සුරැකුම්පත් පරිහරණය කිරීම සඳහා වගකිව යුතු වූ ද, බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක සුරැකුම්පත් ගනුදෙනු නිරවුල් කිරීමට අවසර දෙන්නා වූ හෝ එහි ලා පහසුකම් සලසන්නා වූ නිෂ්කාශන නිවාසයක කර්තව්‍ය ඉටු කරන තැනැත්තකු ද ඇතුළත් වේ ;

"අර්පණය" හෝ "අර්පණය කිරීම" යන්නට, සංස්ථා ප්‍රකාශනයක් මගින් හෝ අන්‍යාකාරයකින් යම් ලැයිස්තුගත සුරැකුම්පත් හෝ එවැනි සුරැකුම්පත්වල සම්බන්ධතාව වටිනාකමක් සඳහා විකිණීමට හෝ බැහැර කිරීමට ගන්නා යම් උත්සාහයක් ඇතුළත් වන නමුත් එවැනි යම් ලැයිස්තුගත සුරැකුම්පත් සම්බන්ධයෙන් ප්‍රතිරක්ෂණ ගිවිසුමකට ඇතුළත් වන ලෙස යම් තැනැත්තකු වෙත කරනු ලබන සද්භාවී ඇරයුමක් ඇතුළත් නොවේ ;

"පොදු සමාගම" යන්නෙන්, 1982 අංක 17 දරන සමාගම් පනතේ 30 වන වගන්තියේ අර්ථකථනය කර ඇති පරිදි වූ "පුද්ගලික සමාගමක්" හැර යම් සමාගමක් අදහස් වේ ;

"හිමිකම් නිකුත් කිරීම" යන්නෙන්, අර්පණය විස්තර කරනු ලබන්නේ කවරාකාරයකින් වුව ද ලැයිස්තුගත පොදු සමාගමක පවත්නා සුරැකුම්පත් හෝ අනාගතයේ දී නිකුත් කරනු ලැබිය හැකි සුරැකුම්පත් ප්‍රතිෂ්ඨාවක් සඳහා සහ ඒ සුරැකුම්පත් මහජනතාවට අර්පණය කිරීමට පෙරාතුව ඒ අර්පණය කරන දිනයේ දී ඒ සමාගමේ ඔවුන් දරනු ලබන සුරැකුම්පත් ප්‍රමාණයට අනුපාතිකව, ඒ සමාගමේ දැනට සිටින සුරැකුම්පත් හිමියන්ට අර්පණය කිරීම අදහස් වේ ;';

(7) "ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය" යන යෙදුමෙහි අර්ථකථනයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථකථනය ඇතුළත් කිරීමෙන් :-

'"ව්‍යාපාර වස්තු ණයට ගන්නා" යන්නෙන්, ලැයිස්තුගත සුරැකුම්පත් ණයට ගැනීමේ ව්‍යාපාරයෙහි නිරතව සිටින තැනැත්තකු අදහස් වේ ;';

(8) "ව්‍යාපාර වස්තු වෙළෙන්දා" යන යෙදුමේ අර්ථකථනයෙහි "යම් පුද්ගලයකු හෝ සංස්ථාවක් අදහස් වේ."; යන වචන ඉවත් කර ඒ වෙනුවට "යම් පුද්ගලයකු හෝ සංස්ථාවක් අදහස් වන නමුත්, ලියාපදිංචි වෙළෙඳපොල අතරමැදියකු වන ප්‍රතිරක්ෂිතයකු අදහස් නොවේ. ";

(9) "ව්‍යාපාර වස්තු වෙළෙන්දා" යන යෙදුමේ අර්ථකථනයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථකථනය ඇතුළත් කිරීමෙන් :—

'"ව්‍යාපාර වස්තු ණයට දෙන්නා" යන්නෙන්, ලැයිස්තුගත සුරැකුම්පත් ණයට දීමේ ව්‍යාපාරයෙහි නිරතව සිටින තැනැත්තකු අදහස් වේ ;';

(10) "භාරකරු" යන අර්ථකථනයේ "බලපත්‍රලත් ඒකක භාරයක් සම්බන්ධයෙන් යෙදෙන විට,", යන වචන වෙනුවට "ඒකක භාරයක් සම්බන්ධයෙන් වන විට," යන වචන ආදේශ කිරීමෙන් ;

(11) "භාරකරු" යන අර්ථකථනයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථකථනය ඇතුළත් කිරීමෙන් :—

"ප්‍රතිරක්ෂිතයා" යන්නෙන්, ලැයිස්තුගත පොදු සමාගමක හෝ ලැයිස්තුගත කිරීමක් සඳහා ඉල්ලුම් කර ඇති සමාගමක සුරැකුම්පත්වල මහජන නිකුතුවක් සම්බන්ධයෙන් වූ දායක නොවුනු ඒ සමාගමේ සුරැකුම්පත් ගාස්තුවක් හෝ වට්ටම් මුදලක් සඳහා මිලට ගැනීමට ඇප වන්නා වූ හෝ අර්පණය සඳහා සම්පූර්ණයෙන් ම දායක වී නොමැති අවස්ථාවක ඒ සුරැකුම්පත් මිලට ගැනීමට ඒ සමාගම සමග සාකච්ඡා කරන්නා වූ යම් තැනැත්තකු අදහස්වන අතර, නිශ්චිත වශයෙන් ම මහජනයාට අර්පණය කිරීමේ අදහසින් යුතුව, ඒ සුරැකුම්පත් මිලට ගන්නා යම් තැනැත්තකු ද ඇතුළත් වේ ;'.

44. 1991 අංක 26 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් නවදුරටත් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනය සංශෝධනය කිරීම.

(1) ඒ උපලේඛනයෙහි I වන කොටසේ "සංස්ථාවකට, ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක් වශයෙන් බලපත්‍රයක් ප්‍රදානය කිරීම" යන වචන වෙනුවට "සංස්ථාවකට ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක් වශයෙන් බලපත්‍රයක ප්‍රදානය කිරීම සහ ඒ බලපත්‍රය අලුත් කිරීම" යන වචන ආදේශ කිරීමෙන් ;";

(2) ඒ උපලේඛනයෙහි II වන කොටසේ—

(අ) "ව්‍යාපාර වස්තු තැරැව්කරුවකුට හෝ ව්‍යාපාර වස්තු වෙළෙන්දකුට හෝ සංස්ථාවකට, බලපත්‍රයක්

ප්‍රදානය කිරීම" යන වචන වෙනුවට "සංස්ථාවකට, ව්‍යාපාර වස්තු තැරැව්කරුවකු හෝ ව්‍යාපාර වස්තු වෙළෙන්දකු වශයෙන් බලපත්‍රයක් ප්‍රදානය කිරීම හෝ ඒ බලපත්‍රය අලුත් කිරීම" යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) ඒ කොටසේ (ඇ) විෂයාංකය සඳහා පහත දැක්වෙන විෂයාංකය ආදේශ කිරීමෙන් :—

"(ඇ) ඉල්ලුම්කාර සමාගම වෙනුවෙන් සේවාදායකයන් සමග කටයුතු කරන සියලු විධායක අධ්‍යක්ෂවරයන් සහ සේවානියුක්තිකයන්, බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය විසින් සහ කොමිෂන් සභාව විසින් වරින් වර නියම කරනු ලබන නියමයන්ට අනුව, බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය විසින් පුහුණු කර සහතික කරනු ලැබූ බව ; සහ

(3) ඒ උපලේඛනයේ III වන කොටසේ—

(අ) "පුද්ගලයකුට, ව්‍යාපාර වස්තු වෙළෙන්දකු වශයෙන් හෝ ව්‍යාපාර වස්තු තැරැව්කරුවකු වශයෙන් බලපත්‍රයක් ප්‍රදානය කිරීමේ" යන වචන වෙනුවට "පුද්ගලයකුට, ව්‍යාපාර වස්තු වෙළෙන්දකු වශයෙන් හෝ ව්‍යාපාර වස්තු තැරැව්කරුවකු වශයෙන් බලපත්‍රයක් ප්‍රදානය කිරීමේ සහ ඒ බලපත්‍රය අලුත් කිරීමේ" යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) ඒ කොටසේ (ආ) විෂයාංකයට ඉක්බිතිව ම පහත දැක්වෙන විෂයාංකය ඇතුළත් කිරීමෙන් :—

"(ආආ) බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය විසින් සහ කොමිෂන් සභාව විසින් වරින් වර නියම කරනු ලබන නියමයන්ට අනුව බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය විසින් පුහුණු කරනු ලැබ සහතික කරනු ලැබූ බව ;".

(4) ඒ උපලේඛනයේ IV වන කොටස ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :—

"IV වන කොටස

ඒකක භාරයක් පවත්වා ගෙන යාම පිණිස කළමනාකරණ සමාගමකට බලපත්‍රයක් ප්‍රදානය කිරීමේ කාර්යය සඳහා සහ ඒ බලපත්‍රය අලුත් කිරීම සඳහා පිළිපැදිය යුතු නියම හා කොන්දේසි මෙසේ ය :—

(අ) ඒකක භාරයේ භාරකරු සහ කළමනාකරණ සමාගම, වෙන වෙනම තැනැත්තන් විය යුතු ය ;

(ආ) භාරකරු, කළමනාකරණ සමාගමේ සම්බන්ධිත තැනැත්තකු නොවිය යුතු ය ;

(ඇ) කළමනාකරණ සමාගම 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ පිහිටුවා ලියාපදිංචි කර තිබිය යුතු අතර, ශ්‍රී ලංකාවෙන් පිටත නිසි ලෙස සංස්ථාගත කරනු ලැබූ හෝ විදේශ රටක යම් ව්‍යවස්ථාවක්, රාජකීය අධිකාර පත්‍රයක්, පේටන්ට් බලපත්‍රයක් ප්‍රකාරව පිහිටුවනු ලැබූ සමාගමක් විය යුතු ය ;

(ඈ) කළමනාකරණ සමාගමට අවශ්‍ය වෘත්තියමය පළපුරුද්ද තිබිය යුතු අතර, එය මූල්‍යමය වශයෙන් ස්ථාවර විය යුතු ය ;

(ඉ) කළමනාකරණ සමාගමේ අධ්‍යක්ෂවරයන් සුදුසු හා නිසි තැනැත්තන් විය යුතු ය ;

(ඊ) පැහැදිලි කිරීමේ සටහන කළමනාකරණ සමාගම විසින් සකස් කර එය කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබිය යුතු ය ;

(උ) භාරකරු, කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබිය යුතු ය ;

(ඌ) කළමනාකරණ සමාගම සහ භාරය ඇති කරන භාරකරු අතර වූ භාර ඔප්පුව කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබිය යුතු ය ;

(එ) භාර ඔප්පුවෙහි—

(i) භාර දේපළ ආයෝජනය කිරීමෙහි ලා වූ සීමා කිරීම් දක්වා තිබිය යුතු ය ;

(ii) භාරකරුගේ වගකීම් දක්වා තිබිය යුතු ය ;

(iii) ඒ භාර ඔප්පුවේ දැක්වෙන යම් අවස්ථාගත තත්ත්වයක් වේ නම්, ඒ තත්ත්වය යටතේ හැර ඒකක හිමියන් විසින් වැඩිදුර ගෙවීමක් නොකළ යුතු බවට හෝ වැඩිදුර වගකීමක් භාර නොගත යුතු බවට විධිවිධාන සැලසිය යුතු ය ;

(iv) ඒකකවල අර්පණ මිල සහ බේරුම් මිල ආගණනය කරන ක්‍රමය දැක්විය යුතු ය :

(v) ඒකක බේරුම් කිරීම අත්හිටුවන අවස්ථාගත තත්ත්වයන් කවරේදැයි දැක්විය යුතු ය ;

(vi) ඒකක හිමියන්ගේ ලේඛනයක් පවත්වා ගෙන යාම සඳහා විධිවිධාන සැලැස්විය යුතු ය :

(vii) භාරයේ යම් රැස්වීමක දී තමාගේ වැදගත් සම්බන්ධතාවක් තිබෙන ව්‍යාපාරික කටයුත්තක් සාකච්ඡා කරන විටක දී, තමාගේ සම්බන්ධතාව හෙළිදරව් කිරීමට භාරකරුට, කළමනාකරණ සමාගමට සහ ඔවුන්ගේ සම්බන්ධිත තැනැත්තන්ට නියම කෙරෙන විධිවිධාන අන්තර්ගත විය යුතු ය ;

(viii) ඒකක භාරයේ විගණකවරුන් වශයෙන් කොමිෂන් සභාවේ රීතිවල නිශ්චය කොට දැක්වෙන සුදුසුකම් ඇති තැනැත්තන් පත් කිරීම සඳහා විධිවිධාන සැලසීම සහ ඒ විගණකවරුන් ඒ සුදුසුකම් දැරීම නතර වූ විට ඔවුන් ඉවත් කරන ලෙස නියම් කිරීමට කොමිෂන් සභාවට බලය දීම කරනු ලැබිය යුතු ය ;

(ix) අලුතින් භාරකරුවකු පත් කරන තෙක් භාරකරුට විශ්‍රාම ගැනීම තහනම් කර තිබිය යුතු ය :

(x) භාරකරුගේ සහ කොමිෂන් සභාවේ අනුමතය ඇතිව හැර, කළමනාකරණ සමාගම විසින් භාරය වෙනුවෙන් ප්‍රතිරක්ෂණ ගිවිසුමකට හෝ උප ප්‍රතිරක්ෂණ ගිවිසුමකට හෝ ඇතුළත් වීම තහනම් කරනු ලැබිය යුතු ය ;

(xi) භාරකරුගේ එකඟත්වය ඇතිව හැර, භාර දේපළවලින් ණය දීම හෝ ප්‍රදානය කිරීම තහනම් කරනු ලැබිය යුතු ය ;

(xii) කළමනාකරණ සමාගම හෝ කළමනාකරණ සමාගමේ යම් සම්බන්ධිත තැනැත්තකු සහ භාරය අතර යම් ගනුදෙනුවක් සඳහා භාරකරුගේ ලිඛිත අනුමතය ලබා ගත යුතු බවට විධිවිධාන සැලැස්විය යුතු ය ;

(xiii) අලුතින් ඇති කරන ලද ඒකක වෙනුවෙන් ගෙවන ප්‍රතිඡ්ඨාව භාරකරු වෙත ලැබුණු වහාම ඒ ප්‍රතිඡ්ඨාව (රඳවා තබා ගැනීමට කළමනාකරණ සමාගමට හිමිකම් තිබෙන යම් අය කිරීමක් අඩු කොට) භාරයට යටත් වන බවට විධිවිධාන සැලැස්විය යුතු ය ;

(xiv) ඒකක හා සම්බන්ධයෙන් වූ සහතිකයක් තුන්වන පාර්ශ්වයකට භාරදිය යුත්තේ, ඒ ඒකක සඳහා ගෙවන ලද ප්‍රතිඡ්ඨාව (කළමනාකරණ සමාගම විසින් රඳවා තබාගත හැකි අය කිරීමක් අඩු කොට) භාරකරු වෙත සතු වී ඇති බවට හෝ සතු වන බවට භාරකරු සෑහීමට පත් වූ විට දී පමණක් බවට විධිවිධාන සැලැස්විය යුතු ය ;

(xv) ඒකකවල ආයෝජනය කිරීමට අවසර ඇති අවම ආරම්භක ආයෝජනය නිශ්චය කොට දැක්විය යුතු ය ; එම මුදල කොමිෂන් සභාවේ අනුමතයට යටත් විය යුතු ය ;

(xvi) ඒකක මිල දී ගැනීම්වලින් අය කළ හැකි උපරිම ආරම්භක අය කිරීම නිශ්චය කොට දැක්විය යුතු ය ; එම අය කිරීම කොමිෂන් සභාවේ අනුමතයට යටත් විය යුතු ය ;

(xvii) කොමිෂන් සභාව විසින් නියම කරනු ලැබූ විට, භාරකරුගේ විෂමචාරය හෝ නොසැලකිලිමත්කම් හේතුකොට ගෙන සිදුවන අලාභ වෙනුවෙන් ඇප වශයෙන් භාරකරු විසින් ඇප තැන්පත් කළ යුතු බවට විධිවිධාන සැලැස්විය යුතු ය ; සහ

(xviii) තත් කාර්යය සඳහා සාදන ලද රීතිවලින් කොමිෂන් සභාව විසින් කලින් කල තීරණය කරනු ලැබිය හැකි වෙනත් තොරතුරු අන්තර්ගත විය යුතු ය.".

(5) ඒ උපලේඛනයේ IV වන කොටසට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් කොටස ඇතුළත් කිරීමෙන් :—

"V වන කොටස

(අ) සංස්ථාවක් වන ආයෝජන කළමනාකරුවකුට, ආන්තික සපයන්නකුට හෝ ප්‍රතිරක්ෂිතයකුට වෙළෙඳපොළ අතරමැදියකු වශයෙන් ලියාපදිංචියක් ප්‍රදානය කිරීමේ කාර්යය සඳහා සහ ඒ ලියාපදිංචිය අලුත් කිරීම සඳහා පිළිපැදිය යුතු නියමයන් සහ කොන්දේසි මෙසේය :—

(i) ඉල්ලුම්කරු, 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ පිහිටුවා ලියාපදිංචි කර තිබිය යුතු අතර, ශ්‍රී ලංකාවෙන් පිටත නිසි ලෙස සංස්ථාගත කරනු ලැබූ හෝ විදේශ රටක යම් ව්‍යවස්ථාවක්, රාජකීය අධිකාර පත්‍රයක් හෝ පේටන්ට් බලපත්‍රයක් ප්‍රකාරව පිහිටුවනු ලැබූ සමාගමක් සහ යම් ලිඛිත නීතියක් මගින් හෝ ඒ යටතේ පිහිටුවන ලද සංස්ථාවක් ද ඊට ඇතුළත් වේ ;

(ii) ඉල්ලුම්කරුගේ අධ්‍යක්ෂවරයන්—

(අ) වස්තු භංගත්වයට පත් වූවන් ලෙස කිසි දිනක ප්‍රකාශයට පත්කර නැති බව ;

(ආ) වෙළෙඳපොල අතරමැදියකු වශයෙන් ස්වකීය ලියාපදිංචිය හෝ ව්‍යාපාර වස්තු භාරකරුවකු, ව්‍යාපාර වස්තු වෙළෙන්දකු හෝ ඒකක භාරයක කළමනාකරණ සමාගමක් වශයෙන් ස්වකීය බලපත්‍රය කොමිෂන් සභාව විසින් අවලංගු කරනු ලැබූ හෝ අත්හිටුවනු ලැබූ සමාගමක තැනැත්තකු නොවන බව නැතහොත් කිසි දිනක එසේ වූ සමාගමක අධ්‍යක්ෂවරුන්ව නොසිටි බව ;

(iii) ඉල්ලුම්කරු වෙනුවෙන් සේවාදායකයන් සමඟ කටයුතු කරන සියලු අධ්‍යක්ෂවරුන්ට සහ සේවා නියුක්තිකයන්ට කලින් කල කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබිය හැකි පරිදි ප්‍රමාණවත් සුදුසුකම් සහ පුහුණුව තිබිය යුතු බව ;

(iv) ඉල්ලුම්කරු යහපත් මූල්‍ය තත්ත්වයෙන් සිටින බව ; සහ

(v) කොමිෂන් සභාව විසින් කලින් කල පනවනු ලැබිය හැකි වෙනත් යම් උපමාන ඉල්ලුම්කරු විසින් ඉටු කරන බව ;

(ආ) පුද්ගලයකු වන ආයෝජන කළමනාකරුවකුට වෙළෙඳපොල අතරමැදියකු වශයෙන් ලියාපදිංචි වීමේ කාර්යය සඳහා සහ ඒ ලියාපදිංචිය අලුත් කිරීම සඳහාත් පිළිපැදිය යුතු නියමයන් හා කොන්දේසි මෙසේය :—

(i) ඉල්ලුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියකු බව ;

(ii) ඉල්ලුම්කරු සුදුසු සහ නිසි තැනැත්තකු බව සහ කවර හෝ අවස්ථාවක වස්තු භංගත්වයට පත් වූවකු ලෙස ප්‍රකාශයට පත්කර නැති බව ;

(iii) කොමිෂන් සභාව විසින් කලින් කල නිරණය කරනු ලැබිය හැකි පරිදි සුදුසුකම් සහ පුහුණුව තිබෙන බව ; සහ

(iv) කොමිෂන් සභාව විසින් කලින් කල පනවනු ලැබිය හැකි වෙනත් යම් උපමාන ඉල්ලුම්කරු විසින් ඉටු කරන බව ;

(ඇ) නිෂ්කාශන නිවාසයක කර්තව්‍ය ඉටු කරන තැනැත්තකු වෙළෙඳපොල අතරමැදියකු වශයෙන් ලියාපදිංචි කිරීමේ කාර්යය සඳහා සහ ඒ ලියාපදිංචිය අලුත් කිරීම සඳහා පිළිපැදිය යුතු නියමයන් සහ කොන්දේසි මෙසේය :—

(i) ඉල්ලුම්කරු, 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ පිහිටුවා ලියාපදිංචි කර තිබිය යුතු අතර ශ්‍රී ලංකාවෙන් පිටත නිසි ලෙස සංස්ථාගත කරනු ලැබූ හෝ විදේශ රටක යම් ව්‍යවස්ථාවක්, රාජකීය අධිකාර පත්‍රයක් ප්‍රකාරව පිහිටුවනු ලැබූ සමාගමක් සහ යම් ලිඛිත නීතියක් මගින් හෝ ඒ යටතේ පිහිටුවන ලද සංස්ථාවන් ද ඊට ඇතුළත් වේ :

(ii) ඉල්ලුම්කාර සමාගමේ අධ්‍යක්ෂවරයන්—

(අ) වස්තු භංගත්වයට පත් වූවන් ලෙස කිසි දිනක ප්‍රකාශයට පත්කර නැති බව ;

(ආ) වෙළෙඳපොල අතරමැදියකු වශයෙන් ස්වකීය ලියාපදිංචිය හෝ ව්‍යාපාර වස්තු නැරැව්කරුවකු, ව්‍යාපාර වස්තු වෙළෙන්දකු හෝ ඒකක භාරයක කළමනාකරණ සමාගමක් වශයෙන් ස්වකීය බලපත්‍රය කොමිෂන් සභාව විසින් අවලංගු කරනු ලැබූ හෝ අත්හිටුවනු ලැබූ සමාගමක තැනැත්තන් නොවන බව නැතහොත් කිසි දිනක එසේ වූ සමාගමක අධ්‍යක්ෂවරුන්ව නොසිටි බව ;

(iii) ඉල්ලුම්කරු යහපත් මූල්‍ය තත්ත්වයෙන් සිටින බව ;

(iv) බලපත්‍රලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක් ඉල්ලුම්කරුගේ කොටස් හිමියකු බව ;

(V) ඉල්ලුම්කරුගේ රීතිවල—

(අ) සුරැකුම්පත් තැන්පත් කරනු ලැබිය හැක්කේ, අත්හිටුවනු ලැබිය හැක්කේ, ආපසු ගනු ලැබිය හැක්කේ හෝ මාරු කරනු ලැබිය හැක්කේ කවර කොන්දේසි යටතේ ද, ඒ කොන්දේසි සම්බන්ධයෙන් ;

(ආ) තැන්පත් කරන ලද සුරැකුම්පත් දැරීම සඳහා ;

(ඇ) තැන්පත් කරන ලද සුරැකුම්පත්වල ගනුදෙනු කිරීම් සැකසුම් කිරීම සඳහා ;

(ඈ) තැන්පත් කරන ලද සුරැකුම්පත් නිරවුල් කිරීම පහසු කරවීම සඳහා ;

(ඉ) තැන්පත්කරුවන්ගේ සම්බන්ධතා ආරක්ෂා කිරීම සහ තැන්පත් කරන ලද සුරැකුම්පත් පිළිබඳ තොරතුරු සහ ඒවායේ ගනුදෙනු කිරීම්වල, ආරක්ෂාව සහ පාලනය සඳහා ;

(ඊ) ඉල්ලුම්කාර සමාගමේ රීති අනුව ක්‍රියා කරනු ලබන බවට නියාමනය කිරීම සහ එකී රීති ක්‍රියාවෙහි යෙදවීම සඳහා;

(උ) රක්ෂණ ඔප්පුවක් හෝ ඔප්පු පවත්වා ගෙන යාම සම්බන්ධයෙන්, සහභාගිවන්නන්ගෙන් ඇපකර ලබා ගැනීම සහ ඉල්ලුම්කරුට එරෙහිව තැන්පත්කරුවන් විසින් කරනු ලබන ඉල්ලීම් නිරවුල් කිරීමේ කාර්යය සඳහා වන්දි අරමුදල් පිහිටුවීම සහ පවත්වා ගෙන යාම සඳහා ; සහ

(ඌ) සාමාන්‍යයෙන් මහජනතාවගේ යහපත උදෙසා නිසි සැලකිල්ල ඇතිව, ඉල්ලුම්කරුගේ ව්‍යාපාරය කර ගෙන යාම සඳහා,

සතුටුදායක විධිවිධාන ඇති කරන බව :

(vi) කොමිෂන් සභාව විසින් කලින් කල පනවනු ලැබිය හැකි වෙනත් යම් උපමාන ඉල්ලුම්කරු විසින් ඉටුකරන බව.

(ඇ) ණය ප්‍රමාණීකරණ නියෝජ්‍යායතනයකට වෙළෙඳපොල අතරමැදියකු වශයෙන් ලියාපදිංචි වීමේ කාර්යය සඳහා සහ ඒ ලියාපදිංචිය අලුත් කිරීම සඳහා පිළිපැදිය යුතු නියම සහ කොන්දේසි මෙසේය :-

(i) ඉල්ලුම්කරු, 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ පිහිටුවා ලියාපදිංචි කර තිබිය යුතු අතර ශ්‍රී ලංකාවෙන් පිටත නිසි ලෙස සංස්ථාගත කරනු ලැබූ හෝ විදේශ රටක යම් ව්‍යවස්ථාවක්, රාජකීය අධිකාර පත්‍රයක්, පේටන්ට් බලපත්‍රයක් ප්‍රකාරව පිහිටුවනු ලැබූ සමාගමක් සහ යම් ලිඛිත නීතියක් මගින් හෝ ඒ යටතේ පිහිටුවන ලද සංස්ථාවක් ද ඊට ඇතුළත් වේ ;

(ii) ඉල්ලුම්කරුගේ අධ්‍යක්ෂවරයන්-

(අ) වස්තු භංගත්වයට පත් වූවන් ලෙස කිසි දිනක ප්‍රකාශයට පත් කර නැති බව ;

(ආ) වෙළෙඳපොල අතරමැදියකු වශයෙන් ස්වකීය ලියාපදිංචිය හෝ ව්‍යාපාර වස්තු තැරැව්කරුවකු, ව්‍යාපාර වස්තු වෙළෙන්දකු හෝ ඒකක භාරයක කළමනාකරණ සමාගමක් වශයෙන් ස්වකීය බලපත්‍රය, කොමිෂන් සභාව විසින් අවලංගු කරනු ලැබූ හෝ අත්හිටුවනු ලැබූ සමාගමක තැනැත්තන් නොවන බව නැතහොත් කිසිම දිනක එසේ වූ සමාගමක අධ්‍යක්ෂවරුන්ව නොසිටි බව ;

(iii) ඉල්ලුම්කරු යහපත් මූල්‍ය තත්ත්වයෙන් සිටින බව ;

(iv) ඉල්ලුම්කරුගේ අධ්‍යක්ෂවරයකු, නිලධරයකු හෝ සේවානියුක්තිකයකු වංචාවක් හෝ

සාපරාධි විශ්වාසය කඩ කිරීම හෝ රැවටීම හෝ සාපරාධි වංචාපහරණය සම්බන්ධයෙන් වරදකරු කරනු ලැබ නැති බව හෝ වස්තු භංගත්වයට පත් වූවකු ලෙස ප්‍රකාශයට පත් කර නැති බව හෝ මේ පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් රීතිවල හෝ නියෝගවල විධිවිධාන කිසිවක් උල්ලංඝනය කිරීමෙහි ලා වරදකරු බවට තීරණය කර නැති බව ;

(v) කොමිෂන් සභාවේ මතය අනුව, ඉල්ලුම්කරුගේ ප්‍රවර්ධකයන් යම් පමණක වත්කම් ඇති සහ අවංක තැනැත්තන් බව සහ ණය ප්‍රමාණනීයකරණ නියෝජ්‍යායතනයක් වශයෙන් කටයුතු කිරීමේ දී ඒ සමාගමට ක්‍රියා කිරීමට සිදු විය හැකි කාරණා සම්බන්ධයෙන් ඔවුනට විශේෂ දැනුමක් තිබෙන බව ;

(vi) ඉල්ලුම්කරුගේ කිසිම අධ්‍යක්ෂවරයකු සංස්ථාමය අස්තිත්වයක හෝ ව්‍යාපාර ආයතනයක හෝ අධ්‍යක්ෂවරයෙක් නොවිය යුතු බව හෝ යම් සංස්ථාමය අස්තිත්වයක, හෝ ව්‍යාපාර ආයතනයක සියයට පහක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් දරන කොටස් හිමියකු නොවිය යුතු බව නැතහොත් වෙනත් යම් ආකාරයකින්, ඉල්ලුම්කරු විසින් ප්‍රමාණනීයකරණය කිරීමට යටත් එවැනි අස්තිත්වයක් කෙරෙහි ඒ අධ්‍යක්ෂවරයාට සම්බන්ධතාවක් නොමැති බව ; සහ

(vii) නීතිය යටතේ නියම කරනු ලබන අවස්ථාවක හැර, ඉල්ලුම්කරුගේ කිසිම අධ්‍යක්ෂවරයකු, නිලධරයකු හෝ සේවානියුක්තයකු විසින් ප්‍රමාණනීයකරණය සඳහා භාවිත කිරීමෙහි ලා අත්කර ගත් තොරතුරු වෙනත් යම් තැනැත්තකුට නිවේදනය නොකළ යුතු බව,

වන්නේ ය.".

14අ වගන්තිය යටතේ පනවන ලද සෙස් බද්ද වලංගු කිරීම.

**45.** සියලු කාර්ය සඳහා මේ පනතේ 14 අ වගන්තියේ විධිවිධාන 1987 සැප්තැම්බර් මස 10 වන දින ක්‍රියාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ අනුව, ඒ දිනයේ දී ආරම්භව, මේ පනත ආරම්භවන දිනයේ දී අවසන් වන කාල සීමාව තුළ අය කරනු ලැබූ සහ ගෙවනු ලැබූ යම් සෙස් බද්දක් වලංගු ලෙස අය කරනු ලැබූ සහ ගෙවනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**46.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.